සාමය හා ප්‍රතිසන්ධානය ගොඩනැගීම වෙනුවෙන්

# ජංගම දුරකථන ජනමාධ්‍යකරණය



MediaCorps *ශිෂ්‍යත්ව වැඩසටහන වෙනුවෙන් ප්‍රායෝගික අත්පොතක්*

## සාමය හා ප්‍රතිසන්ධානය ගොඩනැගීම වෙනුවෙන්

# ජංගම දුරකථන ජනමාධ්‍යකරණය

**කතෘ**
**එම් සී රස්මින්**

**සංස්කරණය (සිංහල පිටපත)**
**මහාචාර්ය අභය බාලසූරිය**
**රුවන් බෝගමුව**

# ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය
# (SDJF)

ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය නිර්මාණශීලී මාධ්‍ය භාවිතය හරහා යහපත් ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කිරීමටත් හඬක් නගන්නට ඉඩක් නැති ආන්තික ප්‍රජාවන්ගේ හඬට ඉඩක් ලබාදීමත් වෙනුවෙන් කැප වී සිටින ශ්‍රී ලාංකික සංවිධානයකි. ආන්තික ජනකොටස් ප්‍රධාන ධාරාව තුළට රැගෙන ඒම වෙනුවෙන් ගුවන්විදුලි නාට්‍ය සංසද නාට්‍ය ප්‍රජා වීඩියෝ, විමර්ශනාත්මක වීඩියෝ, විඩීයෝ කතන්දර, කෙටි චිත්‍රපට සහ සහයෝගාත්මක මාධ්‍යකරණය වැනි විවිධ මාධ්‍ය මෙවලම් භාවිතයෙන් ලාංකික සංවර්ධන ජනමාධ්‍ය අවකාශය තුළ නැවුම් ප්‍රවේශයන් විවර කළ දස වසරක අත්දැකීම් ශ්‍රී ලංකා සංවර්ධන ජනමොධ්‍යවේදී සංසදය සතුව පවතී. සංස්කෘතික දුරස්ථ භාවය අවම කිරීම වෙනුවෙන් ප්‍රජා මාධ්‍ය ශක්තිමත් කිරීම්. ආන්තික කරණය වූ පුද්ගලයන්ට සමාජය තුළට තම හඬ ගෙන ඒමට හැකියාව ලබා දීම සහ තොරතුරු වෙත ඇති ප්‍රවේශය විවර කිරීම ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදයෙහි අනෙකුත් උපායමාර්ගික සැලසුම් වේ.

ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය, අන්තර්ජාතික පර්යේෂණ සහ හුවමාරු මණ්ඩලය (IREX) සමග එක්ව අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනයෙහි (USAID) සහයෝගය ඇතිව ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් උදෙසා මාධ්‍ය බල ගැන්වීමේ (MEND) ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක MediaCorp ශිෂ්‍යත්ව වැඩසටහන, පශ්චාත්-යුධ සහ සංක්‍රාන්තික පසුබිම් නියෝජනය කරන තරුණ සාම ජනමාධ්‍යවේදීන්ට අන්තර් සංස්කෘතික අවබෝධය, විවිධත්වය වැඩි දියුණු කරගැනීමටත් විවිධ ප්‍රජාවන් අතර සබඳතා ශක්තිමත් කරගැනීමටත් සාමුහික ජනමාධ්‍යකරණය මෙවලමක් ලෙස භාවිතා කිරීමට දිරි ගන්වනු ලබන ආයතනයකි.

3/8, ස්වර්ණ පෙදෙස, නාවල පාර, රාජගිරිය, ශ්‍රී ලංකාව.
0117 209 511/2 80 62 65 | Info@ldjf.org | www.ldjf.org

**අයිතිවාසිකම් පිළිබඳ දැන්වීම**
සියලු හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකගේ පූර්ව අනුමැතිය ඇතිව මෙම අත්පොත නැවත මුද්‍රණය හෝ බෙදා හැරීම සිදුකල හැකිය.

**කතෘ:** එම් සී රස්මින්

**සංස්කරණය (සිංහල පිටපත):** මහාචාර්ය අභය බාලසූරිය, රුවන් බෝගමුව

**මුල් පිටුව පිරිසැලසුම සහ සැලසුම:** මොහොම්මදු අස්වර්

**ඡායාරූපකරණය:** මොහොම්මදු යාසීන්, මොහොම්මදු රසීම්

**අන්තර්ගතය පිළිබඳ අයිතිය අත්හැරීමේ ප්‍රකාශය**
ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනය හරහා ඇමරිකානු ජනතාවලබා දුන් සහයෝගය හේතුවෙන් මෙම අත්පොත සකස් කිරීමට හැකියාව ලැබුණි. මෙහි අන්තර්ගතය එහි කතුවරයාගේ සම්පූර්ණ වගකීම වන අතර මෙමඟින් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනයෙහි හෝ එක්සත් ජනපද ආණ්ඩුවෙහි අදහස් පිළිබිඹු නොවේ.

# පටුන


**01 වන කොටස** 01

MediaCorps ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳ හැඳින්වීම

**02 වන කොටස** 05

මාධ්‍ය, ගැටුම සහ විපරිවර්තනය

**03 වන කොටස** 13

MediaCorps පියවර

**04 වන කොටස** 27

බහුමාධ්‍ය කතන්දර නිෂ්පාදනය කිරීම

**05 වන කොටස** 35

01. නිතර අසන ප්‍රශ්න
02. වචන මාලාව
03. සම්පත්
04. ආශ්‍රිත ග්‍රන්ථ හා පරිශීලනයන්

# 01 වන කොටස

# MediaCorps ශිෂ්‍යත්ව වැඩසටහන හඳුන්වා දීම




## MediaCorps අත්පොත

වසර 30 කට අධික කාලයක් ශ්‍රී ලංකාව යුද්ධයෙන් පීඩාවට පත් විය. අර්ථාන්විත ප්‍රතිසන්ධානයක් ළඟා කරගැනීමේ ක්‍රමවේදයක් වශයෙන් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ වන විට අපගේ දේශය කටයුතු කරන හෙයින්, මාධ්‍ය සතු භූමිකාව වැදගත් වේ. සංක්‍රාන්තික පසුබිම තුළ, බලපෑමට ලක් වූ ජනතාවගේ කතන්දර නිර්මාණය කිරීම, යුක්තිය උදෙසා හඬක් නැගීම, සහකම්පනය නිර්මාණය කිරීම, විවිධ ප්‍රජාවන් අතර සබඳතා ශක්තිමත් කරගැනීමට, විශ්වාසය ගොඩ නැගීම, සහ විවිධ ප්‍රජාවන් අතර සක්‍රීය සංවාදයක් පවත්වාගෙන යාම සඳහා සාමූහික ජනමාධ්‍යකරණය සතුව විශාල හැකියාවක් තිබේ.

## MediaCorps ප්‍රවේශය

MediaCorps (MC) වැඩසටහන විවිධ විශ්වාස, වාර්ගික, භාෂා පසුබිම් නියෝජනය කරන යුද්ධයේ බලපෑමට ලක්වූ, පශ්චාත් යුධ ගැටුම්, පූර්ව ගැටුම් සහ ආන්තික වටපිටාවන්ගෙන් පැමිණෙන තරුණ ජනමාධ්‍යවේදීන්ට යුගල වශයෙන් කටයුතු කිරීමට අවස්ථාව සලසාදෙන පුරෝගාමී ප්‍රවේශයක් වේ. එම අරමුණ සාක්ෂාත්කරගැනීම වෙනුවෙන් එකිනෙකා ජීවත්වන සමාජ වටපිටාව තුළ තාවකාලිකව රැඳී සිටිමින්, බලපෑමට ලක් වූ ප්‍රජාවන් අතර යහපත් සබඳතාවක් ගොඩනගාගැනීමට අහිතකර ලෙස බලපාන සංස්කෘතික බාධාවන් සම්බන්ධයෙන් ප්‍රායෝගිකව දැනුමක් ලබාගැනීමට අවස්ථාව සලසා දෙන අතරම සංහිඳියාව ශක්තිමත් කරන්නා වූ සහයෝගාත්මක බහුමාධ්‍ය කතන්දර නිෂ්පාදනයට ඉඩප්‍රස්ථාව සලසා දෙන නව්‍ය ප්‍රවේශයකි.

මෙම අත්පොත, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනයෙහි අරමුදල් සහිතව සහ ජාත්‍යන්තර පර්යේෂණ හා හුවමාරු මණ්ඩලය සමග එක්ව ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින් මෙහෙයවනු ලබන - MediaCorps ශිෂ්‍යත්ව වැඩසටහන, සාමූහික ජනමාධ්‍යකරණය කෙරෙහි නව්‍ය ප්‍රවේශයක් පිණිස වන මාර්ගෝපදේශයක් වේ. MediaCorps ප්‍රවේශය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දීමට සහ MediaCorps මිත්‍රත්ව වැඩසටහන සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික දැනුමක් ලබා දීමට මෙම අත්පොත තුළින් අපේක්ෂා කෙරේ.



## ඉලක්කය

පශ්චාත්-යුධ සහ සංක්‍රාන්තික පසුබිම් නියෝජනය කරන තරුණ සාම ජනමාධ්‍යවේදීන්ට අන්තර් සංස්කෘතික අවබෝධය සහ විවිධත්වය වැඩි දියුණු කරගැනීමටත් විවිධ ප්‍රජාවන් අතර සබඳතා ශක්තිමත් කරගැනීමටත් සාමූහික ජනමාධ්‍යකරණය මෙවලමක් ලෙස භාවිතා කිරීමට දිරි ගැන්වීම MediaCorps වැඩසටහනේ ඉලක්කයයි.

## ඉලක්ක කරගත් පුද්ගල අනුබද්ධ වෙනස්කම්

සිය සහෘදයන්ගේ ජීවිත තුළ පහත සඳහන් වෙනස්කම් පොහොසත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා MediaCorps වැඩසටහන උපායමාර්ගික වශයෙන් සැලසුම් කර ඇත.

## MediaCorps කතන්දර

MediaCorps සහෘදයන් විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් තම කතන්දර නිෂ්පාදනය කරනු ඇත:

- තමන්ගේම ප්‍රජාව නොවන වෙනත් ප්‍රජාවක සියල්ලන්ම ඇතුළත් වන, ප්‍රතිසන්ධානයක් ඇතිවීමට බාධා කරන ගැටලු.
- යුක්තිය ප්‍රතිස්ථාපණ, ගැටුම, අනුකම්පාව සහ ගැටුමේ වින්දිතයන් විඳි දුෂ්කරතාවන් පිළිබඳ සත්‍යය තොරතුරු නිරාවරණය.
- අන්‍යොන්‍ය අවබෝධය, විශ්වාසය සහ එකිනෙකා අතර ආත්ම ශක්තිය ඇති කිරීම සහ ඒ තුළින් ප්‍රතිවාදී ප්‍රජාවන් අතර සබඳතා ශක්තිමත් කිරීම.
- විවිධත්වය පෝෂණයට වැඩි ඉඩක් නිර්මාණය සහ අන්තර් සංස්කෘතික සංවාදය ප්‍රවර්ධනය කිරීම.

## MediaCorps වැඩසටහනට සහභාගීවන්නන්

MediaCorps වැඩසටහනට ඇතුළත් වන්නේ සාමය හා ප්‍රතිසන්ධානය පදනම් කරගත් බහු මාධ්‍ය කතන්දර නිෂ්පාදනය කිරීම සහ ජංගම දුරකථන කතන්දර නිර්මාණය වැනි නව ආකෘතීන් උත්තේජනයට කැමැත්තක් දක්වන තරුණ ජනමාධ්‍යවේදීන්ය. ඔවුන් විවිධ ජනවර්ග හා ආගම්වලට අයත්, විවිධ භාෂා කතා කරන කතාකරුවන්, කෙටි චිත්‍රපට නිර්මාණකරුවන්, බ්ලොග් ලියන්නන්, ඩිජිටල් මාධ්‍ය ක්‍රියාකාරීන්, වෙබ් වාර්තාකරුවන් සහ කතන්දර නිර්මාණ කරුවන් වේ.

### අන්තර් සංස්කෘතික අවබෝධය ශක්තිමත් කිරීම

සංස්කෘතීන් අතර පවතින සමාන අසමානතා පිළිබඳව සහ ඒ සංස්කෘතීන්ට අයත් ජනතාව එකිනෙකා සමග සන්නිවේදනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව පුද්ගලයන් දැනුවත් වූ විට හා ඒ පිළිබඳ අවබෝධ කරගත් විට අන්තර් සංස්කෘතික අවබෝධය නිරායාසයෙන්ම ඇති වේ. පොදු වටිනාකම්, වෙනත් සංස්කෘතියක් සම්බන්ධයෙන් පවතින පූර්ව උපකල්පන හඳුනාගැනීම මෙයට අන්තර්ගතයි. MediaCorps සහෘදයන් විසින් සංස්කෘතික බාධාවන් හා පක්ෂග්‍රාහී ස්වභාවයන් අවබෝධ කරගත යුතු අතර විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව සමග සක්‍රීය සන්නිවේදනයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ කුසලතාවන් හා දැනුම දියුණු කරගත යුතුය.







### අන්‍යෝන්‍ය අවබෝධය සහ විවිධත්වය පෝෂණය කිරීමට ඇති හැකියාව ඉහළ නැංවීම


විවිධත්වය පෝෂණයේදී සෑම පුද්ගලයෙකුගේම අනන්‍යතාව එකිනෙකාට වෙනස් නමුත් මනුෂ්‍යයන් වශයෙන් සමානය යන මූලධර්මය මගින් මෙහෙයවනු ලැබේ. මෙය අවබෝධ කරගැනීමට සහ සිය වාර්තාකරණය තුළින් සංස්කෘතික හා ආගමික විවිධත්වය පෝෂණය කිරීමට ද; වාර්තාකරණයේ දී ජනතාවගේ විවිධත්වයට ගරු කිරීමට ද; එමෙන්ම ආන්තික කරණය වූ කණ්ඩායම් ඇතුළු විවිධ පුද්ගල කණ්ඩායම් කෙරෙහි බලපාන ගැටලු සාකච්ඡා කිරීම සඳහා හැකියාව හා විවෘත මනසක් තබා ගැනීමටද MediaCorps සහෘදයන්ට හැකි විය යුතුය.

## සංවාදයට සුදුසු වාතාවරණයන් ඇතිකිරීමට සඳහා කැපවීම

MediaCorps සහෘදයන් විසින් සාමය සහ සංවාදය පෝෂණය කරන්නා වූ කතන්දර නිෂ්පාදනය කිරීම වෙනුවෙන් සිය හැකියාවන් භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඵලදායී සංවාදයකින් තොරව, ගැටුම් නිරාකරණය හා වැළැක්වීම ධනාත්මක ලෙසින් පරිවර්තනය කිරීම සිදු කළ නොහැක. ප්‍රතිසන්ධානය පිළිබඳ සජීවී හා දීර්ඝ කාලීන සංවාදයක් නිර්මාණය කිරීම සඳහා තම කතන්දර තමන්ගේම සමාජ මාධ්‍ය, වෙබ් අඩවි හෝ වෙනත් මාධ්‍ය වේදිකාවක් තුළ ප්‍රචාරණය කිරීමට මාධ්‍ය බලකා MediaCorps සහෘදයන්ට හැකි විය යුතුය.




## විසංවාදී සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී බහුමාධ්‍ය කතන්දර නිෂ්පාදනයට ඇති හැකියාව




සාමය සංහිඳියාව පිළිබඳ සිත්ගන්නා සුළු කතන්දර නිර්මාණය තුළින් සහ සංවේදී හැඟීම් ජනිත කරීම තුළින් සාමය උදෙසා වන අවස්ථාවන් බිහිකර ගැනීමට අවශ්‍ය බුද්ධිය ඇති වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ගැටුම් පිළිබඳ සංවේදී වාර්තාකරණයට අදාළ සංකල්ප සහ ලක්ෂණ සම්බන්ධයෙන් මනා දැනුමක් MediaCorps සහෘදයන් සතුව තිබීම අපේක්ෂා කෙරේ.




## සත්කාරක සහ වෙනත් බාහිර සමාජයෙ ප්‍රජාවන් සමග සම්බන්ධතා වැඩි දියුණු කිරීම

MediaCorps සහෘදයන් විසින් සංස්කෘතික බාධක තේරුම් ගැනීම, සත්කාර ප්‍රජාව තුළ හා ඊට ආසන්න බාහිර සමාජයේ සිටින්නා වූ විවිධ ආගමික ඇදහිලි හා ජනවාර්ගික කණ්ඩායම්වලට අයත් ජනයා සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම, පවතින සබඳතා ශක්තිමත් කරගැනීමට අවශ්‍ය හැකියාව වැඩි දියුණු කරගැනීම, යන කාරණා අපේක්ෂා කෙරේ.

# 02 වන කොටස

# මාධ්‍ය, ගැටුම් හා ගැටුම් විපරිවර්තනය



## ගැටුම යනු කුමක්ද?

සමාජය පුද්ගලයන් සමූහයකින් සමන්විත වේ. ඔවුහු එකිනෙකාගෙන් වෙනස් වෙති. ඔවුන් දරන අදහස්, මතවාද, ආගමික විශ්වාස, භාෂාව, උගත් නූගත්කම්, දුප්පත් පොහොසත්කම් ආදි විවිධ හේතු මත එම වෙනස්කම් ඇති වේ. සිය අවශ්‍යතාවන්ට හෝ කැමැත්තට තර්ජනයක් වන බවට එකිනෙකා විසින් වටහාගන්නා විටදී පාර්ශවයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර පවතින අසම්මතයක් තුළින් එය පැන නැගිය හැකිය. ගැටුම යනු පොදු යථාර්ථයක් වන අතර යම් අවස්ථාවන් හී දී එය අපගේ සමාජ දිවිය තුළ පොදු සිද්ධාන්තයක් වේ. සිත් බිඳවැටීම්, දුකට පත්වීම්, ආතතිය වැනි ස්වභාවයට පත්වීම්, ප්‍රචණ්ඩත්වයට හා විනාශකාරී ක්‍රියාවලට යොමු වීම දක්වා වර්ධනය විය හැකි ය. එමෙන්ම තමා තුළ මෙන්ම, පුද්ගලයන් අතර ද, පවුල් අතර ද, ප්‍රාදේශීය වශයෙන් මෙන්ම රටවල් අතර ද, කලාපීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තරව ද විවිධාකාරයෙන් ගැටුම් ඇතිවිය හැකි ය. එවැනි ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම ජන සමාජයේ යහපැවැත්මට මෙන්ම තිරසර සාමයක් පවත්වා ගැනීමට ද අතිශයින් වැදගත් වේ.

ගැටුම යන්නෙන් අර්ථ ගැන්වෙන්නේ,

- පාර්ශවයන් අතර පවතින ප්‍රතිවිරුද්ධ ස්වභාවයක්,
- පාර්ශවයන් අතර එකගතාවයක් නොමැතිකමක්,
- සමාජ විසංවාදයන් විසඳීමේ මාර්ගයක්,
- මිනිසාගේ අන්තර් සමාජීය ක්‍රියාකාරීත්වය තුළ පවතින ස්වභාවික ක්‍රියාවලියක්.

## ගැටුමක ප්‍රතිඵලය

"පශ්චාත් ගැටුම" ගැටුම් හා ජාත්‍යන්තර  අධ්‍යයනයන් තුළදී අපැහැදිලි ලෙස භාවිත කරනු ලබන වචන අතරින් එකකි. සාමාන්‍යයෙන්, ජාතිය ගොඩ නැගීම හා සාමය හා යුක්තිය නැවත ස්ථාපනය කිරීම සඳහා ගැටුමකට සම්බන්ධ පාර්ශවයන් එක්ව කටයුතු කරන ප්‍රචණ්ඩකාරී කාල සීමාවකට පසුව එළඹෙන යුගයක් එයින් අදහස් වේ. ගැටුමට පසුව සාමය ගොඩනැගීම යනු ගැටුමෙහි මූල හේතූන් ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු ව්‍යුහයන් දියුණු කරනු ලබන දීර්ඝ කාලීන හා සංකීර්ණ ක්‍රියාවලියක් බවට ජනමාධ්‍යවේදීන් විසින් අවබෝධ කරගත යුතුය. පශ්චාත් ගැටුම් සමය තුළදී, ගැටුමට සම්බන්ධ සෑම පාර්ශවයක්ම ප්‍රතිසන්ධානය ළඟා කරගැනීමට පොදු ඉලක්කයක් සඳහා එක්ව කටයුතු කිරීම ඇතුළු බොහෝ කැපවීම් කළයුතුබව MediaCorps සහෘදයන් මතකයේ තබා ගත යුතුය.




## ගැටුම් කළමනාකරණය

ගැටුම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධ කරගැනීම ජනමාධ්‍යවේදීන්ට බොහෝ විට වැදගත් වේ. ගැටුම් කළමනාකරණය යන්නෙන් අදහස් වන්නේ ගැටුම් ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුනා ගැනීම නොවේ. අවිහිංසාවාදී ක්‍රමවේදයන් හරහා ගැටුම ධනාත්මක අයුරින් කළමණාකරණය සඳහා ක්‍රමවේදයන් හඳුනා ගැනීම එයින් අදහස් වේ. ගැටුම් කළමනාකරණය යනු ගැටුමට සම්බන්ධ පාර්ශවයන් සහයෝගී සංවාදයක් කරා ගෙන ඒම සඳහා, වෙනස්කම් කළමනාකරණය කිරීමට හා අවම කිරීමට ශක්‍ය යාන්ත්‍රණයක් සැලසුම් කිරීම සඳහා වූ පවතින ඵලදායී හා ධනාත්මක ක්‍රියාවලියකි.

## ගැටුම් විපරිවර්තනය කිරීම

ගැටුම් විපරිවර්තනය කිරීම යනු සාමකාමීව සහජීවනයෙන් ජීවත් වීමට අදාළ පාර්ශවයන්ට හැකියාව ලබා දීම වෙනුවෙන් ඔවුන්ගේ දැනුම, අවබෝධය සහ හැකියාවන් හැඩ ගැස්වීම මගින් විවිධ අදියර තුළ ඔවුන් සහභාගී කරගන්නා සංකීර්ණ ක්‍රියාවලියක් වේ. ගැටුම් විපරිවර්තනය කිරීම යන්නට ගැටුමක් ඇති කිරීමට උත්සාහ ගන්නා හෝ එහි පැවැත්මට සහය වන්නා වූ සබඳතා, අභිරුචීන්, ඇතුළත් වේ. පුද්ගලයන් හා ආකල්ප අතර පවතින වෙනස්කම් හඳුනා ගැනීමට සහ එම වෙනස්කම් පිළිගැනීමට උත්සාහ කරන අතරතුර එමගින් ගෞරවය හා මානව හිමිකම් සක්‍රීය ලෙස ප්‍රවර්ධනය කළ යුත්තේය.

## ගැටුම් විපර්වර්තනය තේරුම් ගැනීම

සංක්‍රාන්ති පසුබිමක විවිධත්වය හා සංහිඳියාව ප්‍රවර්ධනය වෙනුවෙන් මාධ්‍යවේදීන් බහු මාධ්‍ය හෝ ජංගම දුරකථන කතාකීමේ කලාව භාවිත කරන්නේ නම්, අන්තර් සංස්කෘතික අවබෝධය, ගැටුම්, ප්‍රතිසන්ධානය, සංක්‍රාන්ති යුක්තිය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ගැටුම් සංවේදී ජනමාධ්‍යවේදය, යුද සහ සාම පුවත්පත් කලාව යනාදි සංකල්ප පිළිබඳව හොඳ අවබෝධයක් තිබීම ඉතාම වැදගත්වේ.

## ගැටුම විශ්ලේෂණය කිරීම

ගැටුම විශ්ලේෂණය කිරීම යනු ගැටුම පිළිබඳ පුලුල් දළ විශ්ලේෂණයක් සහිතව ගැටුමෙහි ආරම්භය, ස්වභාවය සහ ගතිකයන් පිළිබඳ විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීම මගින් ගැටුම විශ්ලේෂණය කිරීම වේ. මතුපිට පවතින ගැටුම් විශ්ලේෂණය, ගැටුම් ලක්ෂණයන්ගෙන් ඔබ්බට පවතින ගැටුමට පාදක වූ ගැටලු දක්වා විහිදෙයි. එමගින් උනන්දුවක් දක්වන සියලු පාර්ශවයන් සතු ආකල්ප හඳුනාගනී; ගැටුමට අදාළ මූලාශ්‍ර හා එහි බලපෑම් ගවේෂණය කරයි; ඓතිහාසික හා සමාජයීය පසුබිම සැළකිල්ලට ගනියි; ගැටුම උත්සන්න වීම හෝ එහි තියුණු බව අඩු වීම පරික්ෂා කරයි.

එසේ හෙයින්, ගැටුම් විශ්ලේෂණය සඳහා ගැටුමට අදාළ මූලික හේතූන් සහ බලපෑම් පිළිබඳ ප්‍රබල දත්ත හා සාක්ෂි අවශ්‍ය වේ. ගැටුමක් අඛණ්ඩ විය හැකි හෙයින්, ගැටුම් විශ්ලේෂණය අසම්බන්ධ ක්‍රියාවලියක් නොවන අතර ගැටුම් චක්‍රය පුරාම එය ඒකාබද්ධ විය යුතුය. පහත සඳහන් කාරණා හඳුනා ගැනීම තුළින් ගැටුම් විශ්ලේෂණයට විශාල පිටිවහලක් වේ.

- ගැටුමෙහි ස්වරූපය හඳුනාගැනීම.
- ගැටුමට පාදක වූ හේතුව හෝ හේතූන්.
- ගැටුම ඇතිවීම හා එහි ප්‍රතිඵල.
- ගැටුමට අදාළ පාර්ශවයන්ගේ පෙළඹවීම, රුචිකත්වයන් සබඳතා සහ ධ්‍රැවලිය.
- අදාළ අංශ සහ විවිධ ක්‍රියාකාරිකයින්.
- ගැටුම පවතින අදියර.
- ගැටුමට අදාළ විවිධ පාර්ශවයන් ගැටුමේ විවිධ අදියර දකින ආකාරය.

මෙය ගැටුම විශ්ලේෂණය කිරීම සඳහා භාවිත කරනු ලබන එක් පිළිගත් ක්‍රමවේදයක් නොමැති බව MediaCorps සහෘදයන් විසින් තේරුම් ගැනීම වැදගත් වේ. විවිධ මට්ටම්වල පවතින ගැටුම් අවබෝධ කරගැනීම සඳහා භාවිත කරනු ලබන විවිධ ගැටුම් විශ්ලේෂණ මෙවලම් තිබේ.






## ගැටුම් කෙරෙහි සංවේදී ජනමාධ්‍යකරණය

ගැටුම් කෙරෙහි සංවේදී ජනමාධ්‍යකරණය, ගැටුම් අවම කිරීමට කටයුතු කරන්නා වූ ජනමාධ්‍යවේදීන් වශයෙන් බොහෝ අවස්ථාවන්හී දී වරදවා තේරුම් ගනු ලැබේ.

නමුත් යම් ගැටුමක් හා සම්බන්ධ එදිරිවාදිකම් අවම වන පරිදි සියලු පාර්ශව නියෝජනයවන ආකාරයේ නිවැරදි, අපක්ෂපාතී සහ සමබර තොරතුරු සපයන මාධ්‍යවේදීන් වෙතින් ගැටුම් කෙරෙහි සංවේදී ජනමාධ්‍යකරණය නිර්මාණය වේ.

ගැටුම් සංවේදී ජනමාධ්‍යකරණය විසින් කිසිදු බාධාවකින් තොරව සන්නිවේදනය කිරීමේ අවකාශයක් ගැටුමට සම්බන්ධ කණ්ඩායම් වෙත ලබා දෙමින් හෘද සාක්ෂියට එකඟව ජනමාධ්‍ය භාවිතා කරයි. ජනමාධ්‍ය විසින් වගකීමකින් යුතුව සියලු පාර්ශවයන්ගේ අදහස් ඉදිරිපත් කිරීම, ඉවසීම ගොඩනැගීම, වැරදි වැටහීම් නැති කිරීම, සහ ඔවුන් වෙනුවෙන් පෙනීසිටීමට සහ කතා කිරීමට ජනතාවට ඉඩ ලබාදෙනු ඇත.

ගැටුම් සංවේදී ජනමාධ්‍යකරණයේ මූලධර්ම කිහිපයක් පහත සඳහන් වේ;

- බලපෑමට ලක් වූ සියලු පාර්ශවයන් සඳහා හඬක් ලබා දීම. ගැටුම යනු හුදෙක් පාර්ශවයන් දෙකක් අතර පමණක් පවතින සටනක් නොවේ.
- "නායකයන්ගේ දෘෂ්ටි කෝණයන්" මත පදනම්ව කතාව මෙහෙයවීම සිදු නොකරන්න.
- තවදුරටත් පාර්ශවයන් බෙදා වෙන් කරන ප්‍රශ්න ඇසීමෙන් වළකින්න, එහෙත් ඒ වෙනුවට වැඩි දුර සාකච්ඡා කිරීම් සඳහා අවකාශය නිර්මාණය කරන්නා වූ ප්‍රශ්න විමසන්න.
- එක් පාර්ශවයකගේ හිතීන්, දුක්පීඩාවන් සහ කරදර වාර්තා කිරීමෙන් වළකින්න. සමබර සංවාදයක් පවත්වා අනෙක් පාර්ශවයද කතන්දරයට රැගෙන එන්න.
- කාරණය සම්බන්ධයෙන් මනෝමූලික මතයක් ඉදිරිපත් නොකරන්න.
- නායකයන් හෝ ගැටුම සම්බන්ධ සැබෑ දැනුමක් නොමැති පුද්ගලයන් විසින් යෝජනා කරන්නා වූ ක්ෂණික හා යථාර්ථවාදී නොවන ප්‍රතිකර්ම ලබා නොදෙන්න.
- කටුක සහ අර්ථ ශූන්‍ය භාෂාව/පින්තූර භාවිත කිරීමෙන් වළකින්න.

## සාම ජනමාධ්‍යකරණය

සාම ජනමාධ්‍යකරණය යනු සාමය පිළිබඳ කතන්දර වාර්තා කිරීමේදී ජනමාධ්‍යවේදීන් මෙහෙයවනු ලබන වැදගත් ප්‍රවේශයක් වේ. ගැටුමට සම්බන්ධ පාර්ශවයන් ජයග්‍රාහකයන් හෝ පරාජිතයන් වශයෙන් නිරූපණය කිරීමට එමගින් අපේක්ෂා නොකරයි, එහෙත් ගැටුමට මූලික වූ හේතුන් පිළිබඳව වඩාත් ගැඹුරින් සොයා බැලීම තුළින් අපක්ෂපාතී වූ ප්‍රවේශයක් සහිතව ගැටුම අවබෝධ කරගැනීමට එමගින් උත්සාහ ගනියි. සාමය පිළිබඳව ජනමාධ්‍යකරණය විනිවිධභාවය සම්බන්ධයෙන් ද වන අතර එය ගැටුමට අදාළ සාධක හා යථාර්ථයන් මත පදනම් විය යුතුය. එසේම;

- සාම ජනමාධ්‍යකරණය යම් පිණිස වූ මූලාරම්භයන් සහ අවිහිංසාවාදය ආවරණය කිරීම ඇතුළත් වේ.
- සාම ජනමාධ්‍යකරණය මගින් කාන්තාවන්, තරුණයන්, ජනවාර්ගික සුළුතරයන් ඇතුළු විවිධ කණ්ඩායම්වල සහභාගීත්වය සහ ගැටුම පරිවර්තනය කිරීම සඳහා වන නිර්මාණශීලී විසඳුම් ඉදිරිපත් කරන්නා වූ විවිධ අදහස් ඇතුළත් වීම සහතික කරයි.
- සාම ජනමාධ්‍යකරණය මගින් වෛෂයික, සමබර සහ විශ්වාසනීය තොරතුරු වඩාත් අවශ්‍ය වන්නා වූ ගැටලු හා තේමාවන් ඉලක්ක කරයි. (සාම ක්‍රියාවලි, සාකච්ඡා, සටන් විරාම, සංක්‍රාන්තික ගැටලු, යුක්තිය, පාලනය, සන්නද්ධ කණ්ඩායම්වල කාර්යභාරය, ආදිය).
- සාම ජනමාධ්‍යකරණය මගින් යම් ප්‍රචණ්ඩත්වයක් ඇති වීමට පෙර ජනවාර්ගික සුළුතර ජන කණ්ඩායම්වල, තරුණයන් සහ කාන්තාවන් ඇතුළත්වන ගැටුම් වැලැක්වීම සඳහා වැළැක්වීමේ පියවර ඇතුළු පියවර සම්බන්ධයෙන් මුල සිටම අවධානය යොමු කරයි.
- සාම ජනමාධ්‍යකරණයට මගින් අදාළ සන්දර්භය මානවකරණය කරන අතර ප්‍රචණ්ඩත්වය තුළ අදෘෂ්‍යමාන වන්නා වූ බලපෑම් පිළිබඳව අවධානය යොමු කරයි. (කම්පනය සහ මහිමය, ව්‍යුහයන්ට/ සංස්කෘතියට සිදු වන හානිය, කාන්තාවන්, තරුණයන් සහ සුළුතර කණ්ඩායම් හා ළමයින් ආන්තිකකරණය, ආදිය)
- සාම ජනමාධ්‍යකරණය මගින් සියලු පාර්ශවයන්ට හඬක් ලබා දෙමින් සහ සහකම්පනය හා අවබෝධය ඇති කරමින් සාමය පිළිබඳ කතන්දර සහ පශ්චාත් යුද සංවර්ධනයන් කෙරෙහි අවධානය යොමු කරයි.
- ධනාත්මක වෙනස්කම් ඇති කිරීම හා ගැටුම් පරිවර්තනය කිරීම උදෙසා කටයුතු කරන්නා වූ ජනතාව හා දේශීය කණ්ඩායම් සම්බන්ධ සැබෑ ජීවිත කතා සෙවීම මගින් ඉවසීම, සහයෝගීතාව, ගැටුම් නිරාකරණය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ ධනාත්මක උදාහරණ ඉස්මතු කර දක්වයි.

## ජනමාධ්‍ය හා ප්‍රතිසන්ධානය

ජෝන් පෝල් ලෙඩාර්ච්ට අනුව, ප්‍රතිසන්ධානය යනු ජනතාව අතර පළුදුවූ සම්බන්ධතාවන් යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන්නා වූ ගතික ක්‍රියාවලියකි.

එය යථා තත්ත්වයට පත් කළ යුතු දේශපාලනික ව්‍යුහයන් හෝ පෙර පැවති තත්ත්වයක් වෙත ආපසු යෑමක් පිළිබඳව නොවේ. පළමුවෙන්ම හා ප්‍රධාන වශයෙන්, එය සබඳතාවන් ගොඩනැගීම පිළිබඳව වේ. මිනිසුන්ට එකට ජීවත් වීමට ක්‍රමයක් සොයා ගැනීමට හැකි වන පරිදි සබඳතාවන් නැවත සකස් කිරීම සඳහා කාලයක් ගත වේ. ප්‍රතිසන්ධානය සඳහා අවශ්‍ය වන්නා වූ අංග හතරක් ලෙඩාර්ච් විසින් හඳුනා ගනියි; සත්‍යය, අනුකම්පාව, යුක්තිය හා සාමය. මෙම අංගයන් වෙන්ව සාකච්ඡා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් පර්යේෂණය කිරීමට නොහැක. එම අංගයන් සාකල්‍යවාදී හා එකිනෙකට සම්බන්ධ කාරණා වශයෙන් දැකිය යුතුය. ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීම සඳහා කතන්දර කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ඉඟි කිහිපයක් පහතින් දැක්වේ;

- සබඳතාවන් ගොඩනැගීම, බිය නැති කිරීම හා පුද්ගලයන් අතර විශ්වාසය ගොඩනැගීම සඳහා ඉහළ ශක්‍යතාවයක් සහිත අවස්ථාවක් සෑම කතන්දරයක් තුළම සොයා ගන්න.
- පශ්චාත් ගැටුම් සංවාදයන්ට මැදිහත් වන්න.
- පශ්චාත් යුද ප්‍රතිසන්ධානය යනු හුදෙක් එක් වරක් සිදු වන වාර්තාකරණයක් නොවන බව සවි බලගන්වන ආකාරයට කතන්දරය සකස් කරන්න. ඊටත් වඩා, විවේචනාත්මක අදහස් සකස් කිරීම සඳහා වන උපාය මාර්ගයත්, ප්‍රචණ්ඩත්වයෙන් ඈත් වී ඉදිරියට ගමන් කිරීම සහ සියල්ලන්ම ඇතුළත් වන ප්‍රජාවක් සිටීමේ වාසිය ලබා ගැනීමත් සමගින් දීර්ඝ කාලීන කැපවීමක් හා ඉවසීමක් ඒ සඳහා අවශ්‍ය වේ.
- සත්‍ය පවසන්න. පශ්චාත් ගැටුම් හා සංක්‍රාන්තික පරිසරයන් තුළ කටයුතු කරන අතරතුර මෙය මාධ්‍යවේදියකුගේ ප්‍රධාන වගකීම විය යුතු බව සිතන්න.
- වින්දිතයන්ගේ කතන්දර පවසන්න. ඔවුන්ගේ කතන්දරය පැවසීම සඳහා ඔවුන්ට හඬක් ලබා දෙන්න.
- යුක්තිය හා යුක්තිය පිළිබඳ පද්ධතීන් වගවීමකින් යුතුව කටයුතු කරන බව තහවුරු කිරීමට උත්සාහ කරන්න.
- මහජන මතයට බලපෑම් කරන, ක්‍රියාවන් බලමුළු ගන්වන, මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා බල කරන කතන්දර පවසන්න.
- යුද්ධය පිළිබඳ සත්‍යය ප්‍රචාරය කිරීම සඳහා වන සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනමාධ්‍ය සතු කාර්යභාරය හඳුනාගන්න.

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ වාර්තාකරණය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව පුද්ගලයකුට එරෙහිව සිදු කරනු ලබන ප්‍රචණ්ඩත්වය වේ. ශාරීරික, චිත්තවේගාත්මක, මානසික සහ ලිංගික ප්‍රචණ්ඩත්වය එයට ඇතුළත් වේ. ප්‍රචණ්ඩකාරී තර්ජන, බලහත්කාරය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සම්පත් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම ද මෙයට ඇතුළත් වේ. මෙම ප්‍රචණ්ඩත්වය ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව, කාන්තාවන්, ගැහැණු ළමයින්, පිරිමි ළමයින් සහ පුරුෂයන්ට අත්විඳීමට සිදු විය හැකිය. එසේ වුවද, විශේෂයෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමයින් මෙම ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමට වැඩි ඉඩක් තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් මෙම කණ්ඩායම් ආරක්ෂා කරගත හැකි ආකාරය සහ පවතින නීතිමය ප්‍රතිකර්ම පිළිබඳව තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් මාධ්‍යයට වැදගත් කාර්යභාරයක් සිදුකළ හැකිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවාගත් තැනැත්තකුගෙන් ප්‍රශ්න විමසීමේ දී හා ඒ පිළිබඳව වාර්තා කිරීමේ දී අනුගමනය කළ යුතු යහපත් ක්‍රමවේදයන් වන්නේ;



## පසුබිම

සම්මුඛ සාකච්ඡාව පවත්වන තැනැත්තන් ද ඇතුළුව ගැටුමෙන් දිවි ගලවා ගත් තැනැත්තන්ට කතා කිරීම සඳහා ආරක්ෂිත හා පහසු පරිසරයක් ඇත්දැයි තහවුරු කරන්න. උදාහරණයක් වශයෙන්, පිරිමි සම්මුඛ පරීක්ෂකයකුට වඩා කාන්තා සම්මුඛ පරීක්ෂකයකු විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කාන්තාවකගෙන් ප්‍රශ්න විමසන්නේ නම් එය වඩාත් සුදුසු වේ.

සම්මුඛ සාකච්ඡාවේ අරමුණ පැහැදිලි කරන්න. සමහර අවස්ථාවන්හිදී ඔබගේ සම්මුඛ සාකච්ඡාව තුළින් ඔහුගේ/ ඇයගේ ගැටළුව විසඳීමට හැකි නොවනු ඇත. නමුත් ඔබ විසින් එකී දිවි ගලවා ගත් තැනැත්තාට/තැනැත්තියට අයුක්තියට එරෙහි ඉඩක් හා හඬක් ලබා දෙයි.



## ප්‍රශ්න

ඔබ අසන්නා වූ ප්‍රශ්න මගින් දිවි ගලවාගත් තැනැත්තා/තැනැත්තිය පිළිබඳ යම් පෞද්ගලික තොරතුරක් හා එම පුද්ගලයා විසින් රහසක් වශයෙන් තබා ගැනීම කැමැති ඔහුට/ඇයට මුහුණ දීමට සිදු වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ විස්තර සෘජුව හෝ වක්‍රව ඉල්ලා නොසිටින බවට සහතික වන්න.

දිවි ගලවාගත් තැනැත්තාට/තැනැත්තියට පහසුවෙන් පිළිතුරු දීමට හැකිවන පරිදි විවෘත ප්‍රශ්න අසන්න. දිවි ගලවාගත් තැනැත්තාගේ චිත්තවේගී ප්‍රතිචාර ලබා දීමට පෙළඹවීම සඳහා අහිතකර භාෂාව සහ ප්‍රශ්න භාවිත කිරීමෙන් වළකින්න.

යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම අවස්ථාවක දී සම්මුඛ සාකච්ඡාව නැවැත්වීමට ඔහුට/ඇයට හැකි බව ඔවුන්ට අවබෝධ කරවීමට උත්සාහ කරන්න.



## වාර්තාකරණය

ඔබගේ වින්දිතයන් සමග ගනුදෙනු කරන අවස්ථාවේ දී සහ වාර්තාකරණයේ දී සංවේදීව, සහකම්පනයෙන්, සදාචාරාත්මක හා අපක්ෂපාතී ලෙස කටයුතු කරන්න.

දිවි ගලවාගත් තැනැත්තාට නිර්ණාමික ලෙස ජීවත් වීමට අවශ්‍ය නම් (විශේෂයෙන්ම ඔවුන් බාල වයස්කරුවකු නම්) ඔවුන්ගේ නම සඳහන් නොකරන්න. එසේම, ඔවුන්ගේ අත්දැකීම පිළිබඳව සංවේදනය හට ගන්නා ආකාරයේ විස්තර ඇතුළත් නොකරන්න.

දිවි ගලවාගත් තැනැත්තන් කෙරෙහි වගවීමෙන් හා වගකීමෙන් කටයුතු කරන්න. ඔවුන් විසින් ලබා දෙන්නා වූ තොරතුරුවලට සිදු වන්නේ

## විවිධත්වය ආවරණය කිරීම

විවිධත්වය යන්නට සන්නිවේදන ශෛලිය, වෘත්තීය මාවත, ජීවිත අත්දැකීම, අධ්‍යාපනික පසුබිම, භූගෝලීය පිහිටීම, ආදායම් මට්ටම, විවාහක අවිවාහක බව, දෙමව්පියන්ගේ තත්ත්වය සහ පෞද්ගලික ආකල්පයන්ට බලපාන වෙනත් විචල්‍යයන් ආදී, පුද්ගලයන්ට ආවේණික ලක්ෂණ හා අත්දැකීම් පිළිබඳ අසීමිත පරාසයක් ඇතුළත් වේ. වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වර්ණය, වයස, ජාතිය, ආගම, දුබලතාවය, ජාතික සම්භවය සහ ලිංගික නැඹුරුතාවය මත පදනම් වූ වෙනස්කම් හඳුනා ගැනීම, එම වෙනස්කම්වලට ගරු කිරීම, සහ අගය කිරීම ද විවිධත්වය යන්නෙන් අදහස් වේ.

විවිධත්වය ආවරණය කිරීම යනු MediaCorps හි ප්‍රධාන අංග අතරින් එකක් වේ. විවිධ ප්‍රජාවන්ට අයත් ජනතාව අතර පවතින සංස්කෘතික, ආගමික හා සමාජීය පරිචයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ජීවත් වන බොහෝ මිනිසුන් තුළ අඩු දැනුමක් හා දැනුවත්භාවයක් පවතින බව සොයා ගෙන ඇති අධ්‍යයනයන් කිහිපයක් තිබේ. මේ හේතුවෙන් අවිශ්වාසය, අනවබෝධය සහ අන්‍යෝන්‍ය සැකය ඇති වේ. සත්කාරක ප්‍රජාව සමග ගත කරන කාලය අතරතුර MediaCorps සහෘදයන් විසින් විවිධ ප්‍රජාවන් තුළ පවතින පොහොසත් විවිධත්වය ආවරණය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. විවිධත්වය ආවරණය කිරීම සම්බන්ධයෙන් ඉඟි කිහිපයක් පහත දැක්වේ;

- පුද්ගලයකුගේ ජාතිය, වර්ණය, ආගම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගිකත්වය හෝ ලිංගික නැඹුරුතාවය හෝ වෙනත් යම් ශාරීරික හෝ මානසික රෝගයක් හෝ දුබලතාවයක් සම්බන්ධයෙන් සිදු කරනු ලබන අගතිගාමී හා විවේචනාත්මක සඳහන් කිරීම්වලින් වැළකීම.
- සියලු දෙනාම එකිනෙකාට වෙනස් වන හෙයින් එක් ආකෘතියකට හිර කිරීමෙන් වළකින්න. ඒකාකෘතියක් ඇති කිරීම යනු ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සංස්කෘතිය හෝ වාර්ගිකත්වය මත පදනම් වූ යම් නිශ්චිත ලක්ෂණයකට අනුව සියලු ජනතාව අසාධාරණ ආකාරයට එකට කණ්ඩායම්ගත කිරීම වේ. එක් තැනැත්තකුගේ චර්යාව හෝ විශ්වාසය ඔහු අයත් සුළුතරයේ සියලු ජනතාවට අදාළ වන බවට නිරූපණය කිරීම නිවැරදි නොවේ.
- විවිධත්වයෙහි බලය පිළිබඳව දැනුවත්භාවයක් ඇති කරවීම සඳහා මාධ්‍ය කතන්දර තුළ පුද්ගලයන්ගේ වෙනස්කම් හුවා දක්වන්න.
- විවිධත්වය පිළිබඳව පවතින අනවබෝධය හා අවිශ්වාසය ආමන්ත්‍රණය කරන්න.
- විවිධ ආකල්ප සහ පසුබිම් නිවැරදිව හා සාධාරණ අයුරින් ආවරණය කරන්න. හුදෙක් වෙනස් පුද්ගලයන් පෙන්වීම පමණක් ප්‍රමාණවත් නොවේ.

## ජනමාධ්‍යකරණයට අදාළ ආචාර ධර්ම

1954 දී පවත්වන ලද ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IFJ) ලෝක සම්මේලනයේ දී සම්මත වූ වෘත්තීයමය හැසිරීම් පහත දැක්වේ. 1986 දී පැවැත්වූ ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සංගමයේ ලෝක සම්මේලනයේ දී මෙම ප්‍රකාශනය සංශෝධනය විය. මාධ්‍යවේදීන් උදෙසා වන සම්මත වෘත්තීය හැසිරීම් සංග්‍රහයක් වශයෙන් මෙම අන්තර්ජාතික ප්‍රකාශනය පුලුල් ලෙස පිළිගෙන ඇත:

- සත්‍යයට හා සත්‍යය දැනගැනීමට මහජනයා සතු අයිතියට ගරු කිරීම යනු ඕනෑම මාධ්‍යවේදියකුගේ පළමු කාර්යය වේ.

මෙම කාර්යය ඉටු කිරීමේ දී, පුවත් අවංක ලෙස එකතු කිරීම සහ පළ කිරීම තුළ පවතින නිදහස පිළිබඳ මූලධර්මයන් සහ සාධාරණ අදහස් පළ කිරීමට හා විවේචනයට ඇති අයිතිය ජනමාධ්‍යවේදියා විසින් සෑම අවස්ථාවකදී ම ආරක්ෂා කළ යුතුය.

- ජනමාධ්‍යවේදියා විසින් තමන් හොඳින්ම දන්නා කරුණු අනුව පමණක් වාර්තා කළ යුතුය. මාධ්‍යවේදියා විසින් අත්‍යවශ්‍ය තොරතුරු වසන් කිරීම හෝ සාවද්‍ය ලේඛන ඉදිරිපත් කිරීම සිදු නොකළ යුතුය.
- පුවත්, ඡායාරූප සහ ලේඛන ලබා ගැනීම සඳහා මාධ්‍යවේදීන් විසින් සාධාරණ හා ආචාර සම්පන්න ක්‍රමවේද පමණක් භාවිත කළ යුතුය.
- හානිදායක ලෙසින් සාවද්‍ය බවට සොයා ගත් යම් පළකරන ලද තොරතුරක් නිවැරදි කිරීම සඳහා මාධ්‍යවේදියා විසින් සිය උපරිමයෙන් කටයුතු කළ යුතුය.
- විශ්වාසයෙන් යුතුව ලබාගත් ඕනෑම තොරතුරු මූලාශ්‍රයක් සම්බන්ධයෙන් මාධ්‍යවේදියා විසින් වෘත්තීයමය අවංකභාවය පවත්වාගෙන යා යුතුය.
- මාධ්‍ය සින් වෙනස් කොට සැළකීම වැඩි කිරීමේ අවදානමක් ඇති බව මාධ්‍යවේදියා විසින් දැනුවත් විය යුතු අතර ජාතිය, ලිංගිකත්වය, ලිංගික නැඹුරුතාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් අදහස් සහ ජාතික හෝ සමාජීය සම්භවයන් ආදී දේ මත පදනම්ව සිදු වන එවැනි වෙනස්කොට සැළකීම්වලට සහය වීම වැළැක්වීම සඳහා හැකි උපරිමයෙන් කටයුතු කළ යුතුය.

මාධ්‍යවේදියා විසින් පහත සඳහන් වැරදි, දරුණු වෘත්තීයමය වැරදි වශයෙන් සැළකිය යුතුය;

- වෙනත් අයකු විසින් පළ කරන ලද දෙයක් තමාගේ ස්වයං නිර්මාණයක් ලෙස පළ කිරීම.
- බොරු චෝදනාව, අපවාදය, ලිඛිත අපහාසය, අභූත චෝදනා; සහ පුවත් හෝ තොරතුරු පළ කිරීම හෝ සැඟවීම සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලබා දෙන කුමන ආකාරයේ හෝ අල්ලසක් පිළිගැනීම.

- සෑම රටකම සාමාන්‍ය නීතිය තුළ, ජනමාධ්‍යවේදීන් විසින් වෘත්තීය කාරණාවන්හී දී කිසිදු රජයක් හෝ වෙනත් ආකාරයක් මගින් සිදු කරනු ලබන සියලු ආකාරයේ මැදිහත්වීම් නොසලකන අතර සිය සහෘදයන්ගේ බල ප්‍රදේශය පමණක් සැළකිල්ලට ගත යුතුය.

# සංවේදී මාතෘකා සම්බන්ධයෙන් මිනිසුන්ගෙන් ප්‍රශ්න විමසීමට අදාළ ඉඟි

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රචණ්ඩත්වයෙන් දිවිගලවාගත් තැනැත්තකුගෙන් ප්‍රශ්න විමසීම ආරම්භ කිරීමට පෙර, මෙම ප්‍රචණ්ඩත්වය මගින් යම් පුද්ගලයකු කෙරෙහි ඇති කළ හැකි බලපෑම අවබෝධ කරගැනීමට සහ එය පිළිබඳව සැළකිල්ලට ගැනීමට කාලය ගන්න. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රචණ්ඩත්වය සෑම තැනැත්තකුටම කාන්තාවකටම, පුරුෂයෙකුටම මෙන්ම ළමයින්ටද බලපාන්නා වූ අත්දැකීමක් වේ.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රචණ්ඩත්වයේ බලපෑම් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතර එම බලපෑම දීර්ඝකාලීන විය හැකි අතර කාලයත් සමග වෙනස් වීමට ද හැකිය. පොදු බලපෑම් යන්නට ශාරීරික තුවාල, අසනීප තත්ත්වයන්, සහ කම්පනය, කාංසාව හා පශ්චාත් කම්පන සහගත ආතතිය ආශ්‍රිත ආබාධ වැනි මානසික ගැටලු ඇතුළත් වන අතර එය මේවාට පමණක් නමුත් එයට සීමා නොවේ.

- මීට අමතරව, දිවි ගලවාගත් පුද්ගලයන් නිහඬ කරන හා ඔවුන්ගේ අත්දැකීම පිළිබඳව කතා කිරීමෙන් ඔවුන්ව වළකන කරුණු ලෙස සමාජීය ආකල්ප, ගර්භාවන් හා ආරක්ෂාව හැඟීන්විය හැකිය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රචණ්ඩත්වයෙන් දිවිගලවාගත් තැනැත්තන් වෙත ගොස් ඔවුන්ගේ කතන්දරය බෙදා ගන්නා ලෙස ඔබට පවසන අවස්ථාවේදී, ඔවුන්ගේ අත්දැකීමට අනුකම්පාවෙන් හා සංවේදිබවින් යුක්තව සැළකීම අත්‍යවශ්‍ය වේ.

- සම්මුඛ සාකච්ඡාව පිළිබඳ තීරණවලදී ඔබගේ සාකච්ඡාවට සහභාගී වන තැනැත්තා ඇතුළත් කරගන්න. එසේම ඔවුන්ගේ දායකත්වයට හා අදහස්වලට ගරු කරන්න. එහි සිටින කරුණාවන්ත පුද්ගලයකු සමග ඔවුන්ගේ කතන්දරය බෙදාගැනීම හේතුවෙන් තමන් බලගැන්වී ඇති බවට සාකච්ඡාවට සහභාගී වන තැනැත්තාට හැඟවීම මෙහි ඉලක්කය වේ. අනෙක් අතට, සාකච්ඡාවට සහභාගී වන තැනැත්තාගේ තත්ත්වය තේරුම් නොගන්නා, ඉක්මන් හෝ නිරන්තරයෙන් ප්‍රශ්න නගන සාකච්ඡාවක් තුළින් තමන් නැවතත් වින්දිතයකු වූ බව හෝ නැවතත් සූරා කෑමට ලක් වන බවට එකී තැනැත්තාට හැඟෙනු ඇත.

- ඔබගේ සාකච්ඡාව සූදානම් කිරීමේ දී හා එය සිදු කිරීමේ දී සාකච්ඡාවට සහභාගී වන තැනැත්තා පිළිබඳව නිරතුරුව සැළකිලිමත් වන්න.



# 03 වන කොටස


# MediaCorps හි පියවර

පියවර 04 — පුහුණු කිරීමේ වැඩසටහන

පියවර 03 — ජනමාධ්‍යවේදීන්ට දැනුම් දීම සහ ඔවුන් සමග ගිවිසුම් අත්සන් කිරීම

පියවර 02 — අයදුම්පත් කැඳවීම සහ ඇගයීම

පියවර 01 — තෝරා ගැනීමේ නිර්ණායක


පියවර 09
MediaCorps සමාලෝචන සැසිය නොහොත් ස්මරණය
පියවර 08
කතන්දරය පළ කිරීම සහ බෙදා හැරීම
පියවර 07
කතන්දරය නිෂ්පාදනය කිරීම
පියවර 06
කතන්දරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම
පියවර 05
සත්කාරක අත්දැකීම

# 1 වන පියවර
# තෝරා ගැනීමේ නිර්ණායක

අයදුම්පත් කැඳවීම දියත් කිරීමට පෙර තෝරා ගැනීමේ ක්‍රියාවලිය පූර්වයෙන් සැලසුම් කරනු ලැබිය යුතුය. MediaCorps හි ඉලක්කය ළඟා කරගැනීම සඳහා, විවිධ විශ්වාස, ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්, වාර්ගිකත්ව, සහ භාෂා කණ්ඩායම් නියෝජනය කරන්නා වූ තරුණ මාධ්‍යවේදීන් සියල්ලන්ම ඇතුළත් කරගැනීම සහ ඔවුන් සඳහා අවස්ථාවන් ලබා දීම ඉතා වැදගත් වේ. තරුණ මාධ්‍යවේදීන් තෝරාගැනීම සඳහා වන නිර්ණායකයන් පහත සඳහන් පරිදි වේ.

- අදාළ දීර්ඝ කාලීන වෘත්තීයමය ඉලක්ක සහ ප්‍රතිසන්ධානය හා සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා ඇති කැපවීම පෙන්වීමට තරුණ ජනමාධ්‍යවේදීන් සතු හැකියාව.
- බහුමාධ්‍ය හරහා කතන්දර පැවසීම භාවිත කිරීමට ඇති හැකියාව හෝ එය ඉගෙන ගැනීමට ඇති කැමැත්ත.
- ක්ෂේත්‍ර නිෂ්පාදනය අතරතුර තම ප්‍රජාව සමග සිටීමෙන් ලැබෙන තෘප්තිය අත්හැරීමට ඇති කැමැත්ත සහ හැකියාව.
- සමාජ මාධ්‍ය සහ වෙබ් මාධ්‍ය තුළ නිරන්තරයෙන්ම කටයුතු කිරීම.





# 2 වන පියවර
## අයදුම්පත් කැඳවීම සහ ඇගයීම

තෝරාගැනීමේ නිර්ණායක දියුණු කිරීමෙන් පසුව, අයදුම්පත් කැඳවීම දියත් කළ හැකිය. ලැබී ඇති ආකාරය මත පදනම්ව, තරුණ, ක්‍රියාකාරී සාමය පිළිබඳ මාධ්‍යවේදීන් ආකර්ෂණය කරගැනීම සඳහා ප්‍රධාන ජනප්‍රිය මාධ්‍ය භාවිත කරනු ලැබිය හැකිය. එසේ වුවද, සාමාජ මාධ්‍ය යනු වඩාත් විශාල සහ භූගෝලීය වශයෙන් විහිදුණු ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා වීම සඳහා පවතින සෑම විටම වියදම් රහිත, එහෙත් ඵලදායී ක්‍රමවේදයක් වේ. විභව්‍ය අයදුම්කරුවන් විසින් ජනමාධ්‍යවේදීන් වශයෙන් ඔවුන් විසින් පූර්වයෙන් සිදු කරන ලද කටයුතුවලට අදාළ සම්බන්ධතා සහ ඔවුන්ගේ හැකියාවන් හා කැපවීම් සනාථ කළ හැකි නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සහිතව මාර්ගගත අයදුම් පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.



## MediaCorps තේරීම් ක්‍රියාවලියට අදාළ පියවර පහත සඳහන් වේ

1. **අයදුම්කරුවන් තේරීම:** අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 35ට අඩු සහ සාමය හා ප්‍රතිසන්ධානය යන ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ අත්දැකීම් මත පදනම්ව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කරනු ලැබේ. ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදයේ ත්‍රි පුද්ගල සාමාජික සමිටුවක් විසින් එක්ව පළමුවෙන්ම ඉදිරිපත් කරන ලද අයදුම්පත මත පදනම්ව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කරනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින් මුළු ලකුණු 40 ක් සහිත IREX ආයතනය විසින් අනුමත කරන ලද ඇගයීමේ ආකෘතියක් දියුණු කර ඇත. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කරන කමිටුව විසින් ඒ ඒ වටයට අදාළ අවම ලකුණු ප්‍රමාණයක් තීරණය කරනු ලැබේ.

2. **දුරකථන සම්මුඛ පරීක්ෂණය:** ඉන් පසුව වැඩසටහන් අධ්‍යක්ෂක සහ වැඩසටහන් නිලධාරියා විසින් එක්ව දුරකථන මාර්ග ඔස්සේ සිදු කරනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් ඇගයීම සිදු කරනු ලැබේ. දුරකථන සම්මුඛ පරීක්ෂණය අතරතුර, අයදුම්කරුගේ ජනමාධ්‍ය අත්දැකීම් හා MediaCorps මිත්‍රත්වයට සම්බන්ධ වීමට තිබෙන අභිප්‍රේරණය සම්බන්ධයෙන් වැඩිදුරටත් ප්‍රශ්න කරන අතර ඔවුන්ගේ ඉවසීමේ මට්ටම පරීක්ෂා කිරීම සඳහා ද ප්‍රශ්න කිහිපයක් අසනු ලැබේ. දුරකථන සම්මුඛ පරීක්ෂණය සඳහාද පූර්වයෙන් සැලසුම් කරන ලද ලකුණු ලබා දීමේ නිර්ණායක තිබෙන අතර ඒ සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 ක් වේ.

3. **යොමු පරීක්ෂාව:** අවසානයේ දී, සහෘදයන් විසින් ලබා දෙන ලද නිර්දේශකයන් ඇමතීම මගින් කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පිළිබඳව යොමු පරීක්ෂාවක් සිදු කරනු ඇත. අයදුම්කරුවාගේ නිර්මාණශීලීත්වය, නව්‍යකරණය, නොපසුබස්නා උත්සාහය, විවේචනාත්මක චින්තනය සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇතුළු කාරණා කිහිපයක් සම්බන්ධයෙන් අයදුම්කරුවා ශ්‍රේණිගත කරන ලෙසට නිර්දේශකයා වෙත යොමු කරනු ලබන පරීක්ෂා කිරීමේ විශේෂිත නිර්ණායකයක් ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින් දියුණු කර ඇත. යොමු පරීක්ෂාවක දී ලබා දෙන උපරිම ලකුණු එක් නිර්දේශකයකු සඳහා ලකුණු 10 බැගින් වේ. මෙම ඇගයීමේ අදියර තුන මත පදනම්ව, අයදුම්කරුවන් සඳහා 100 න් ලකුණු ලබා දෙනු ඇති අතර මේ අනුව අවම සීමාවට ඉහළින් ලකුණු ලබා ගෙන ඇති අයදුම්කරුවන් අදාළ වැඩසටහන වෙනුවෙන් තෝරා ගනු ලැබේ.

## 3 වන පියවර
## ජනමාධ්‍යවේදීන්ට දැනුම් දීම සහ ගිවිසුම් අත්සන් කිරීම

අනෙක් වැඩ කටයුතු හා කැපවීම් සැලසුම් කිරීම සඳහා තරුණ මාධ්‍යවේදීන් හට ප්‍රමාණවත් කාලයක් ලබා දීම සඳහා හැකි ඉක්මනින් මාධ්‍යවේදීන්ට දැනුම් දීම වැදගත් වේ. යම් අයදුම්කරුවකු තෝරා ගෙන ඇත්ද යන්න පිළිබඳව දැනුම් දීම විද්‍යුත් තැපෑල හෝ ලිපියක් මගින් යොමු කරනු ලැබේ. මිත්‍රත්ව වැඩසටහනෙහි නියම හා කොන්දේසිවලට අනුගත වීම සඳහා ඔවුන්ට හැකියාවක් සහ කැමැත්තක් තිබේද යන්න පිළිබඳව තහවුරු කරගැනීම සඳහා MediaCorps සහෘදයන් සමග ගිවිසුම් අත්සන් කිරීම ඉතා වැදගත් වේ. ගිවිසුම තුළ වැඩසටහනෙහි ස්වභාවය, ගිවිසුමෙහි කාලසීමාව, අදාළ පාර්ශවයන්ගේ වගකීම්, බුද්ධිමය දේපලවල හිමිකාරීත්වය සහ සෑම සහෘදයකු සඳහාම ලබා දීමට නියමිත ගෙවීම් ප්‍රමාණය ආදී කරුණු සඳහන් වේ.

## 4 වන පියවර
## පුහුණු කිරීමේ වැඩසටහන

ගිවිසුම් අත්සන් තැබූ සහෘදයන්යට දින පහක පුහුණු වැඩසටහනක් සඳහා ආරාධනා කරනු ඇත. පුහුණු වැඩසටහනෙහි අරමුණ වන්නේ MediaCorps වැඩසටහන පිළිබඳ දළ අදහසක් ලබා දීමයි. පුහුණුව අතරතුර, තරුණ ජනමාධ්‍යවේදීයෙකු විසින් තමන් කිසි දිනක කටයුතු කර නොමැති, සහ වෙනස් වාර්ගික, භාෂාමය කණ්ඩායමකට, ආගමික කණ්ඩායමකට හෝ භූගෝලීය පසුබිමකට අයත් හවුල්කරුවකු තෝරා ගනු ඇත. මෙම යුගලය එක් වී ක්ෂේත්‍ර නිෂ්පාදන හා සත්කාරක සැලැස්ම දියුණු කරනු ඇත. පුහුණුවෙහි කොටසක් වශයෙන්, අත්දැකීම් සහිත විශේෂඥයින් විසින් පවත්වනු ලබන අන්‍යොන්‍ය ක්‍රියාකාරී සැසි හරහා මාධ්‍යවේදීන් විසින් පහත සඳහන් මාතෘකා සම්බන්ධයෙන් හොඳ දැනුමක් ලබා ගනු ඇත.

- ගැටුම් වැළැක්වීම, සාමය ගොඩනැගීම සහ පශ්චාත් යුද ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් ජනමාධ්‍ය සතු කාර්යභාරය.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී කතන්දර ඉදිරිපත් කිරීම.
- බහුමාධ්‍ය/ස්මාට් ජංගම දුරකථන භාවිතයෙන් වීඩියෝ කතන්දර නිර්මාණය කිරීම.
- සමාජ මාධ්‍ය භාවිතය හා සමාජ මාධ්‍ය හරහා MediaCorps වැඩසටහන තුළින් නිර්මාණය කළ කතන්දර ඵලදායී ලෙස බෙදා හැරීම.



## 5 වන පියවර
## සත්කාරක අත්දැකීම

මාධ්‍යවේදීන් යුගලයන් විසින් ඔවුන්ට අදාළ ප්‍රදේශයන් තුළ සති එකක් හෝ දෙකක් දක්වා වූ කාල සීමාවන් සඳහා එකිනෙකා වෙනුවෙන් සත්කාරක/ආගන්තුක ලෙස කටයුතු කරනු ඇත. සෑම මාධ්‍යවේදියෙක්ම සත්කාරක හා ආගන්තුක යන දෙපාර්ශවයම නියෝජනයට කටයුතු කරනු ඇත. සත්කාරක විසින් ඔහුගේ/ඇයගේ ප්‍රජාව සම්බන්ධයෙන් ඉගෙන ගැනීම; එහි විවිධත්වය පිළිබඳව ඉගෙනීම; ප්‍රජාව තුළ ප්‍රතිසන්ධානය කෙරෙහි බලපාන ගැටළු හඳුනා ගැනීම; සබඳතා ගොඩනගා ගැනීම; සහ MediaCorps ඉලක්කය නිරූපණය වන ආකාරයේ පරිපූර්ණ බහුමාධ්‍ය/ජංගම දුරකථන වීඩියෝ කතන්දරයක් නිර්මාණයට ආගන්තුක තැනැත්තා වෙත පහසුකම් සලසනු ඇත.

# මනා සංවිධානය

## 01 ප්‍රවාහනය

සත්කාරක ප්‍රජාවන් සිටින ස්ථානයන් වෙත යාම සඳහා බස් රථ හා දුම්රිය වැනි වඩාත් පහසු හා ආරක්ෂිත පොදු ප්‍රවාහන සේවාවක් භාවිත කරන ලෙසට සහෘදයන් වෙත උපදෙස් ලබා දී ඇත. ගම්මානය තුළ ගමන් කිරීම සඳහා ත්‍රීරෝද රථ කුලියට ලබා ගත හැකිය.

## 02 ආහාර

දේශීය සත්කාරක තැනැත්තා විසින් ආගන්තුක සහෘදයා සඳහා ආහාර වේල් තුනක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, ක්ෂේත්‍ර කටයුතු අතරතුර, ආගන්තුකයා හා සත්කාරක යන දෙපාර්ශවයටම සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබා දෙන වෙනත් ඕනෑම ස්ථානයකින් ආහාර ලබා ගත හැකිය. සත්කාරක විසින් ආගන්තුකයා වෙත සාම්ප්‍රදායික ආහාර ලබා දිය යුතුය, සැබවින්ම සෑම දිනයක දීම අලුත් ස්ථානයකින් අලුත් ආහාර වේලක් ලබා දීමට වග බලාගත යුතුය.

## 03 නිවෙස් වෙත යාම

සත්කාරක විසින් ඔහුගේ/ඇයගේ ඥාතීන්/මිතුරන්ගේ නිවෙස් වෙත අවම වශයෙන් සංචාරයන් දෙකක් සැලසුම් කරනු ඇතැයි අපෙක්ෂා කෙරේ. දිවා ආහාරය හෝ රාත්‍රී ආහාරය මීට ඇතුළත් විය හැකි අතර මිනිසුන් වැඩි පිරිසක් හමු වීමට, සංස්කෘතිය අත් විඳීමට හා සංස්කෘතික විවිධත්වය පිළිබඳ අංග පැහැදිලි කරගැනීමට අවස්ථාවක් ලබා දිය හැකිය. එක් රැයක් සඳහා, සත්කාරක විසින් ආගන්තුකයාට නොදන්වා ඔහුව මිතුරෙකුගේ හෝ ඥාතියෙකුගේ නිවසක් වෙත රාත්‍රී ආහාරය සඳහා කැටුව යා යුතුය. සත්කාරක තැනැත්තා ආගන්තුකයා සමග එහි රැඳී නොසිටිය යුතු අතර සත්කාරක පවුල සමග තනිව කටයුතු කිරීම සඳහා ආගන්තුකයාට ඉඩ ලබා දිය යුතුය.

## 04 නවාතැන් පහසුකම්

සත්කාරක විසින්, හැකි සෑම අවස්ථාවකදීම, ඔහුගේ/ඇයගේ නිවසෙහි නවාතැන් පහසුකම් ලබා දිය යුතුය. එසේ සිදු කිරීමට නොහැකි නම්, ඔහු/ඇය විසින් විශ්වාසනීය අසල්වැසියකුගේ/ඥාතියකුගේ නිවසෙහි ආරක්ෂිත ස්ථානයක් සූදානම් කළ යුතුය. සෑම රාත්‍රියක දීම නින්දට යාමට පෙර, ආගන්තුකයා විසින් ඔවුන්ගේ අත්දැකීම් හා උගත් දේ පිළිබඳව සාකච්ඡා කරමින් සත්කාරක තැනැත්තා සමග අදාළ දිනය පිළිබඳව මතකයට නැංවිය යුතුය.

## 05 පිරිවැය

සහෘදයන් වෙත කුඩා දීමනාවක් ලබා දෙනු ඇත. ක්ෂේත්‍ර චාරිකාව අතරතුර, අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා සත්කාරක තැනැත්තා විසින් දරන ලද පිරිවැය ආවරණය කිරීම සඳහා ආගන්තුක සහෘදයා විසින් මෙම දීමනාවෙන් සාධාරණ මුදල් ප්‍රමාණයක් භාවිත කළ යුතුය.

## 06 ආරක්ෂාව

තම ජීවිතයට හෝ සත්කාරක තැනැත්තාගේ ජීවිතයට තර්ජනයක් විය හැකි හෝ ජීවිතය අනතුරට පත් කළ හැකි කිසිදු සිදුවීමක් හෝ ප්‍රචණ්ඩකාරී අවස්ථාවක් හෝ වෙනත් යම් කතන්දරයක් MediaCorps සහෘදයන් විසින් ආවරණය නොකළ යුතු යැයි අපේක්ෂා කෙරේ. එකිනෙකාගේ සාමාන්‍ය ආරක්ෂාව හා යහ පැවැත්ම සම්බන්ධයෙන් සත්කාරක සහ ආගන්තුකයා යන දෙපාර්ශවයම විසින් සැළකිලිමත් විය යුතුය. එසේ වුවද, යම් හදිසි අවස්ථාවක දී එකී අවස්ථාව සම්බන්ධයෙන් කටයුතු කරන අතරතුර ඒ සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශවයන් දැනුවත් කරන බවට සහතික වීම සඳහා MediaCorps ක්‍රියාවලිය තුළ ආරක්ෂිත සැලැස්මක් තිබේ.

# ක්ෂේත්‍ර නිෂ්පාදන ක්‍රියාවලිය

## දිනය 01 – හුරු පුරුදු වීම

### සත්කාරකගේ භූමිකාව

- සත්කාරක විසින් ආගන්තුකයාව සත්කාරක පවුලට, අසල්වැසියන්ට, යහළුවන්ට සහ සත්කාරක ප්‍රජාවට අයත් වෙනත් පුද්ගලයන්ට හඳුන්වා දෙනු ලැබේ.
- ආගන්තුකයාට සත්කාරක ප්‍රජාව තුළ තිබෙන සම්ප්‍රදායික ආහාර හඳුන්වා දෙයි (සෑම දිනකම අලුත් ස්ථානයක දී අලුත් ආහාර වේලක් ලබා දෙනු ලැබේ).
- සත්කාරක විසින් සත්කාරක ප්‍රජාව තුළ තිබෙන සුවිශේෂී ස්ථානයන් වෙත ආගන්තුක තැනැත්තා රැගෙන යයි.

### ආගන්තුකයාගේ භූමිකාව

- ආගන්තුක තැනැත්තා සුදුසු කතන්දර තේමාවක් සොයා ගන්නා අතර එම කතාවට අදාලව තමන් හමු වීමට අපේක්ෂා කරන තැනැත්තන්ගේ ලැයිස්තුවක් සකස් කරයි.
- සත්කාරකගේ සහය ඇතිව ආගන්තුකයන් විසින් ක්ෂේත්‍ර කතන්දර නිෂ්පාදනය කිරීමේ සැලැස්මක් දියුණු කරයි.
- එහි රැඳී සිටින කාලය පුරාවටම "මතක දිනපොතක්" පවත්වාගෙන යයි.

## දිනය 02 – දත්ත එකතු කිරීම සහ වලංගු කිරීම

### සත්කාරකගේ භූමිකාව

- සත්කාරක විසින් ප්‍රජාව තුළ තිබෙන්නා වූ විවිධ ස්ථානයන් වෙත ආගන්තුක තැනැත්තා රැගෙන යන අතර ප්‍රජාව තුළ සිටින විවිධ තැනැත්තන්ට ආගන්තුක තැනැත්තා හඳුන්වා දෙයි.

### ආගන්තුකයාගේ භූමිකාව

- කතන්දරය පිළිබඳව තව දුරටත් දැන ගැනීම පිණිස එම කතාවට අදාල ප්‍රධාන පාර්ශවකරුවන් මුණ ගැසෙයි.
- හඳුනාගත් ගැටලුව හා කතන්දර අදහස පිළිබඳ ප්‍රශ්න 5 සඳහා ආගන්තුකයා විසින් පිළිතුරු සොයාගත යුතුය. (කුමක්ද, කවුද, කවදාද, කොහේද, ඇයි සහ කොහොමද)
- කතන්දරයේ පසුබිමට ආගන්තුකයා හුරු වෙයි.
- කතන්දරය තුළ නිරූපණය කළ හැකි යැයි අදහස් කරන්නා වූ පුද්ගලයන් සමග ආගන්තුකයා හුරුපුරුදු වෙයි. මේ සඳහා රැස්වීම්, සාකච්ඡා, ක්ෂේත්‍ර චාරිකා හා ස්ථානය නැරඹීමට යාම ආදිය අවශ්‍ය වනු ඇත.

## දිනය 05 – කතන්දරය නිෂ්පාදනය කිරීම

### සත්කාරකගේ භූමිකාව

- සත්කාරක විසින් ආගන්තුකයාගේ ඉල්ලීම අනුව සංචාරයන් සඳහා පහසුකම් සලසා දෙයි.
- සත්කාරක විසින් ඔහුට/ඇයට සමීප යම් තැනැත්තකු හමු වීම සඳහා ආගන්තුකයා රැගෙන යන අතර සත්කාරක ප්‍රජාවේ නිවසකට යාම පිළිබඳ අත්දැකීමක් ඔහුට ලබා දෙයි. දේශීය දිවා හෝ රාත්‍රී ආහාරයක් මීට ඇතුළත් විය හැකිය.

### ආගන්තුකයාගේ භූමිකාව

- ආගන්තුකයා විසින් සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, කතන්දරය රූගත කිරීම, සහ අවශ්‍ය සාක්ෂි හා අතිරේක වාචික සාක්ෂි එකතු කිරීම සිදු කරයි.

## දිනය 06 – කතන්දරය නිෂ්පාදනය කිරීම

### සත්කාරකගේ භූමිකාව

- සත්කාරක විසින් ආගන්තුකයාගේ ඉල්ලීම අනුව සංචාරයන් සඳහා පහසුකම් සලසා දෙයි.

### ආගන්තුකයාගේ භූමිකාව

- ආගන්තුකයා විසින් ගන්නා ලද රූප රාමු, සම්මුඛ සාකච්ඡා ආදිය සංස්කරණය කර තම කතන්දරයේ පළමු පිටපත සම්පූර්ණ කරයි.
- 6 වන දිනයේ අවසානයේ ආගන්තුකයා විසින් තම කතන්දරයේ පළමු පිටපත තම ක්ෂේත්‍ර උපදේශකයාට එවිය යුතුය.

## කතන්දරය සැලසුම් කිරීම

**දිනය 03**

### සත්කාරකගේ භූමිකාව

- සත්කාරක විසින් ආගන්තුකයාගේ ඉල්ලීම අනුව සංචාරයන් සඳහා පහසුකම් සලසා දෙයි.

### ආගන්තුකයාගේ භූමිකාව

- ආගන්තුකයා විසින් කතන්දරයේ පසුබිම සම්බන්ධයෙන් අවබෝධය ලබා ගනියි. කතන්දරයේ පසුබිම යනු ඔවුන්ගේ කතන්දරය තුළ යම් අයකුට දැකීමට අවශ්‍ය වන්නා වූ සියලු දේ වේ - ස්ථානය, චරිතයන්ගේ ක්‍රියාකාරකම්, ජනතාව, සත්කාරක ප්‍රජාව තුළ තිබෙන කාලගුණය, රූගත කිරීමේ ක්‍රම වේදය, භාවිත කරන ලද දර්ශන ඛණ්ඩ, කථාව ස්ථාපනය කරන ආකාරය, හා කතන්දරය ආරම්භ වන හා අවසන් වන ස්ථානය. මේ අයුරින් කතන්දරය සම්පූර්ණයෙන්ම සැලසුම් කරන්න.

## කතන්දරය නිෂ්පාදනය කිරීම

**දිනය 04**

### සත්කාරකගේ භූමිකාව

- සත්කාරක විසින් ආගන්තුකයාගේ ඉල්ලීම අනුව සංචාරයන් සඳහා පහසුකම් සලසා දෙයි.

### ආගන්තුකයාගේ භූමිකාව

- ආගන්තුකයාවිසින් සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, කතන්දරය රූගත කිරීම, සහ අවශ්‍ය සාක්ෂි හා අතිරේක වාචික සාක්ෂි එකතු කිරීම සිදු කරයි.

## ඔබගේ පූර්ව නිෂ්පාදනය අවසන් කිරීම

**දිනය 07**

### සත්කාරකගේ භූමිකාව

- ක්ෂේත්‍ර උපදේශකයාගේ උපදෙස් අනුව සත්කාරකගේ කතන්දරයට තව දුරටත් අවශ්‍ය වන රූප රාමු ආදිය ගැනීමට සහය වෙයි.

### ආගන්තුකයාගේ භූමිකාව

- තම ක්ෂේත්‍ර උපදේශකයාගේ උපදෙස් අනුව තම කතන්දරයට තව දුරටත් අවශ්‍ය රූප රාමු, සම්මුඛ සාකච්ඡා ලබා ගත යුතුය.
- තම කතන්දරය තව දුරටත් සංස්කරණය කර සම්පූර්ණ කළ පසු එය නැවතත් ක්ෂේත්‍ර උපදේශකයට එවිය යුතුය. ඔහුගේ අනුමැතිය ලැබුණු පසු අවසන් නිෂ්පාදනය ව්‍යාපෘති නිලධාරීට එවිය යුතුය.

## සමුගැනීම හා ආපසු යාම

**දිනය 08**

### සත්කාරකගේ භූමිකාව

- ආගන්තුකයා නැවත තම නිවස බලා යාමට සුදුසු ආරක්ෂිත ප්‍රවාහන මාධ්‍යයක් සලසා දීම.

### ආගන්තුකයාගේ භූමිකාව

- ආගන්තුකයා සත්කාරක සහෘදයාගෙන් සහ ඔහුගේ/ඇයගේ පවුලෙන් සමු ගනියි.
- සිය ප්‍රජාව නියෝජනය කරන්නා වූ කුඩා තිළිණයක් හෝ ඔවුන් එහි රැදී සිටි කාලය පිළිබඳ මතක සටහනක් (උදා: ඡායාරූපයක්) ආගන්තුකයා විසින් හුවමාරු කරගනියි.
- ඔවුන් පිටත් වන වේලාව, ගමන් කර ආකාරය සහ පැමිණීමට අපේක්ෂා කරන වේලාව සම්බන්ධයෙන් ආගන්තුකයා විසින් ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේ සංසදය වෙත දැනුම් දෙයි.

## සටහන

ක්ෂේත්‍ර නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩිදුර මාර්ගෝපදේශ සඳහා කරුණාකර නිතර අසනු ලබන ප්‍රශ්න කොටස වෙත යොමු වන්න.

සතියක් සඳහා වන සැලැස්ම ඉහතින් ඉදිරිපත් කර ඇති අතර පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් සහෘදයන් සම්බන්ධ විය යුතුය.

## දිනපතා

- MediaCorps සහෘදයන් විසින් දිනකට අවම වශයෙන් එක් සංස්කෘතික සංචාරයක් සිදු කළ යුතුය. (සංස්කෘතික කණ්ඩායම් හමු වීම, ධීවර වෙළඳපොළකට යාම, ආගමික ස්ථානයකට යාම/ ආගමික කණ්ඩායම් හමු වීම ආදිය).
- සෑම රාත්‍රියකම MediaCorps සහෘදයක් විසින් එකිනෙකා සමග සුහද කතාබහක් කළ යුතුය අතර එම අවස්ථාවේදී ඊළග දිනය පිළිබඳ සැලසුම් කළ යුතුය.

## ■ දින හත ඇතුළත

- සත්කාරක ප්‍රජාව සමග රැඳී සිටින කාලය අතරතුර MediaCorps සහෘදයන් විසින් අවම වශයෙන් සංස්කෘතික අවස්ථා දෙකකට හෝ සහභාගී විය යුතුය.
- MediaCorps ක්ෂේත්‍ර නිෂ්පාදන ක්‍රියාවලියේ අවසාන කාල සීමාවේදී, සෑම ආගන්තුක මාධ්‍යවේදියෙකුටම වෙනත් ප්‍රජාවකට අයත් අලුත් මිතුරන් අවම වශයෙන් පස් දෙනෙකු සිටිය යුතුය.
- සත්කාරක ප්‍රජාව පිළිබඳ මතකයන් සහිත ඡායාරූප සහ වීඩියෝ හැකිතාක් එකතු කරගන්න.
- සහයෝගී කතන්දරය සඳහා දර්ශන එකතු කරන්න. ප්‍රජාවන් ද්විත්වයටම බලපාන පොදු ගැටළුවක් සම්බන්ධයෙන් සත්කාර කිරීමේ (පළමු සහ දෙවැනි වටවලින් පසුව) මෙම කතන්දරය නිෂ්පාදනය කළ යුතුය. එසේ වුවද, සහෘදයන්ට එක් ප්‍රජාවකට අදාළව වීඩියෝ දර්ශන ලබා ගත හැකිය.




U.S.ARMY
MediaCorps
MediaCorps
IREX

# ක්ෂේත්‍ර නිෂ්පාදන ක්‍රියාවලිය තුළ කළයුතු නොකළයුතු දේ

## ආගන්තුකයා

### සිදු කළ යුතු දේ

- ආගන්තුක තැනැත්තා විසින් සත්කාරකයාගේ සංස්කෘතික පරිචයන්ට ගෞරව කළ යුතුය.
- ආගන්තුක තැනැත්තා විසින් සත්කාරකයා, සත්කාරක පවුල සහ ප්‍රජාව සමග නිහතමානීව හා මිතුරුකමින් සිටිය යුතුය.
- සත්කාරක ප්‍රජාව ගැන ඉගෙන ගැනීමට සත්කාරක සමග මිත්‍රශීලි සහ විවෘත සංවාද පැවැත්විය යුතුය.
- ආගන්තුකයා විසින් තමන් රැඳී සිටින කාලය සම්බන්ධයෙන් සෑම විටම වාර්තා තබා ගත යුතුය. ඔබ රැඳී සිටින කාලය අතරතුර දිනපොතක් පවත්වාගෙන යා යුතුයි.
- ආගන්තුකයන් විසින් සත්කාරක ප්‍රජාවට අයත් ජනතාව හමු විය යුතුය. ඔවුන් සමග විවෘතව හා ගෞරවයෙන් යුක්තව කතාබහ කල යුතුයි.
- ආගන්තුකයා විසින් ඔවුන්ගේ සත්කාරක සමග වෘත්තීමය එහෙත් මිත්‍රශීලී සබඳතාවක් පවත්වාගෙන යා යුතුය.
- ආගන්තුකයා විසින් එහි යාමට පෙර සත්කාරක ප්‍රජාව පිළිබඳව සොයා බැලිය යුතුය.
- ආගන්තුකයා විසින් තමන්ට හමු වන පුද්ගලයන්ට ස්තූති කළ යුතුය.
- ආගන්තුකයා විසින් සත්කාරක පවුල සමග විනීතව හැසිරිය යුතුය.
- ආගන්තුකයා විසින් සත්කාරක පවුලට උදව් කළ යුතුය.

### සිදු නොකළ යුතු දේ

- ආගන්තුකයා විසින් සත්කාරක විසින් ලබා දෙන යෝජනා අපහාසාත්මක ලෙස ප්‍රතික්ෂේප නොකළ යුතුය.
- ආගන්තුකයා විසින් විවේචනාත්මකව සත්කාරක/ සත්කාරක ප්‍රජාව සමග තර්ක කිරීම හෝ අභියෝග කිරීම සිදු නොකළ යුතුය.
- ආගන්තුකයා විසින් සත්කාරක ප්‍රජාව සාවද්‍ය ලෙස විනිශ්චය නොකළ යුතුය.
- සත්කාරක ප්‍රජාව සමග තිබෙන රැස්වීම් හෝ හමුවීම් සඳහා ආගන්තුකයා ප්‍රමාද නොවිය යුතුය.
- සත්කාරක ප්‍රජාවේ කැමැත්තකින් තොරව ලබා ගත් ඡායාරූප හෝ වීඩියෝ ආගන්තුකයා විසින් පළ නොකළ යුතුය.
- ආගන්තුකයා හෝ සත්කාරක අවදානමේ හෙළන කතන්දර ආගන්තුකයා විසින් නිෂ්පාදනය නොකළ යුතුය.
- අදහස් ලබා දීමේ දී ආගන්තුකයා පක්ෂපාතී නොවිය යුතු අතර මධ්‍යස්ථභාවය පවත්වාගෙන යාම සඳහා උත්සාහ කළ යුතුය.
- ආගන්තුකයා කැටුව වෙනත් පුද්ගලයකු පැමිණෙන්නේ නම් ආගන්තුකයා විසින් ඒ පිළිබඳව සත්කාරක වෙත දැනුම් දී කැමැත්ත ලබා ගත යුතුය.

## සත්කාරක

### සිදු කළ යුතු දේ

- සත්කාරක විසින් ආගන්තුක තැනැත්තාට ඔහුගේ/ ඇයගේ නිවසේ නවාතැන් ලබා දෙන බවට සහතික විය යුතු අතර එය සිදු කිරීමට නොහැකි නම් සත්කාරක විසින් ආසන්නතම හා ආරක්ෂිතම ස්ථානයෙහි ආගන්තුක වෙනුවෙන් නවාතැන් ලබා දීමට සහතික විය යුතුය.
- ආගන්තුක තැනැත්තාගේ පැමිණීම සම්බන්ධයෙන් සත්කාරක විසින් ප්‍රදේශයේ අදාළ ග්‍රාම නිලධාරීවරයා වෙත දැනුම් දිය යුතුය.
- සත්කාරක විසින් ආගන්තුකයාගේ හා ඔහු/ඇය රැඳී සිටින ස්ථානයේ ආරක්ෂාව තහවුරු කළ යුතුය.
- සත්කාරක විසින් ඔහුගේ/ඇයගේ ප්‍රජාවේ ජනතාව හමුවීම සඳහා ආගන්තුකයාට උදව් කළ යුතුය.
- සත්කාරක විසින් සත්කාරක ප්‍රජාව තුළ ආගන්තුක තැනැත්තා වෙත පහසුවක් හා පිළිගැනීමක් දැනවීමට කටයුතු කළ යුතුය.
- සත්කාරක ප්‍රජාව සම්බන්ධයෙන් හොඳම අත්දැකීම ආගන්තුකයා වෙත ලබා දීමට සත්කාරක උත්සාහ කළ යුතුය.
- සත්කාරක විසින් ආගන්තුකයාට සහ ඔහුගේ/ඇයගේ මනාපයන්ට ගරු කළ යුතුය.

### සිදු නොකළ යුතු දේ

- ආගන්තුකයාගේ කතාන්දර නිෂ්පාදන කාර්යය සම්බන්ධයෙන් සත්කාරක අනිසි ලෙස මැදිහත් නොවිය යුතුය.
- ආගන්තුකයා එහි රැඳී සිටින කාලය අතරතුර කිසිදු අවස්ථාවක දී සත්කාරක විසින් ඔහුව තනි නොකළ යුතුය.
- සත්කාරක විසින් අගන්තුකයාව අවදානම් ස්ථාන වලට රැගෙන නොයා යුතුය.
- සත්කාරක තම ප්‍රජාව තුල අගන්තුකයාගේ ගැවසීම හෝ සත්කාරක ප්‍රජාවේ මිනිසුන් සමග කතා කිරීම සීමා නොකළ යුතුය.
- සත්කාරක, තම ආගන්තුකයා මුහුණ දෙන අපහසුතා නොසලකා නොහැරිය යුතුය.
- MediaCorps ක්‍රියාවලියට ඍජුවම අදාළ නොවන ස්ථාන වලට සත්කාරක තම අගන්තුකයාව රැගෙන නොයා යුතුය.

1. එම ප්‍රජාව පිළිබඳව පුලුල් දැනුමක් හා අඛණ්ඩ අවබෝධයක් ලබා ගැනීම සඳහා සෑම සහෘදයකු විසින්ම එක් චාරිකාවක් තුළ දී අඛණ්ඩ දින හතක සංචාරය සම්පූර්ණ කළ යුතු බවට බෙහෙවින්ම නිර්දේශ කරනු ලැබේ. එසේ වුවද, ව්‍යතිරේඛ අවස්ථාවන්හී දී සත්කාරක ප්‍රජාව තුළ අඛණ්ඩව දින හතක් රැඳී නොසිටීම සම්බන්ධයෙන් වලංගු හේතුවක් ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය වෙත (කලින්) ලබා දීමට යම් සහෘදයකුට හැකි වන විට දී, ක්ෂේත්‍ර කාර්යය සම්පූර්ණ කිරීම සඳහා එකී දින හත උපරිම ගමන් තුනක් දක්වා (දින 3+2+2) වෙන් කිරීමට එම සහෘදයාට හැකි වේ. අනෙක් අතට, දින හතකට වඩා වැඩි කාලයක් ගත කිරීමට යම් සහෘදයකු කැමැත්තක් දක්වන්නේ නම්, සත්කාරක ප්‍රජාව හා එහි සංස්කෘතිය ගවේශනය  කිරීම, කතන්දර සෙවීම, කතන්දර නිෂ්පාදනය කිරීම සහ සත්කාරක ප්‍රජාව සමග කතන්දරය වලංගු භාවයට පත් කිරීම සඳහා දීර්ඝ කාල සීමාවක් වෙන් කළ හැකියි.

2. සහයෝගී කතන්දරය නිෂ්පාදනය කිරීමේ දී, සහෘදයන් දෙදෙනා විසින් පළමුවෙන්ම ඔවුන්ගේ ප්‍රජාවන් ද්විත්වය සම්බන්ධයෙන්ම බලපාන එක් පොදු ගැටලුවක් සම්බන්ධයෙන් එකඟ විය යුතුය. ඉන් පසුව එක් එක් සහෘදයා විසින් එකඟ වූ ගැටලුවට අදාළව ඔවුන්ගේ ප්‍රජාවේ අදාළ වීඩියෝ දර්ශන එකතු කරගත යුතුය. ප්‍රතිසත්කාරක වටයේ දී, සහෘදයන් දෙදෙනාගේම වීඩියෝ දර්ශන  එක් සහයෝගී කතන්දරයක් ලෙස සකස් කිරීම සඳහා අතිරේක දිනයක් එක් කරනු ඇත.




## ආරක්ෂක සැලැස්ම

හදිසි අවස්ථාවක දී, ආගන්තුක තැනැත්තා විසින් වහාම සත්කාරක වෙත දැනුම් දිය යුතු අතර සත්කාරක විසින් ඉන්පසුව අදාළ පාර්ශවයන්ට දැනුම් දෙනු ඇත. එසේම ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදයේ ව්‍යාපෘති නිලධාරීන් ද එම අවස්ථාවේ දීම දැනුවත් කළ යුතුය. ව්‍යාපෘති නිළධාරීන් විසින් වැඩසටහන් අධ්‍යක්ෂක වෙත දන්වනු ඇති අතර ඔහු විසින් හැකි ඉක්මනින් එය අයිරෙක්ස් (IREX) වෙත දැනුම් දෙනු ඇත. ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය සම්බන්ධ කරගත හැකි ආකාර දෙකක් පහත සඳහන් වේ:

## මතක දින පොත


සත්කාරක ප්‍රජාව තුළදී ලැබෙන අත්දැකීම් සහෘදයන් විසින් කුඩා දිනපොතක සටහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. වඩාත් බලවත් හා බලපෑමක් සහිත මතකයන් අල්වා ගැනීම සඳහා MediaCorps සහෘදයන් වෙත ලබා දෙන මාර්ගෝපදේශන ප්‍රශ්න කිහිපයක් පහත දැක්වේ. MediaCorps සහෘදයන් විසින් පහත සඳහන් ප්‍රශ්න අතරින් ඕනෑම ප්‍රශ්නයක් සඳහා ශ්‍රව්‍ය හා දෘෂ්‍ය සාක්ෂි සහිතව ඔවුන්ගේ දිනපොතේ හෝ සමාජ මාධ්‍ය තුළ පිළිතුරු ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිය අභ්‍යන්තර වෙනස් වීම හෝ යම් නිශ්චිත සංස්කෘතියක් හෝ ප්‍රජාවක් සම්බන්ධයෙන් ඔවුන් විසින් දැරූ ආකල්පය මිත්‍රත්ව වැඩසටහන හේතුවෙන් වෙනස් වී ඇත්තේ කෙසේද යන්න පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා මෙම අභ්‍යාසය සහෘදයන් වෙත උපකාරී වනු ඇත.

- සත්කාරක පවුල මුණ ගැසීමට පෙර ඔබ තුළ පැවති භීතීන් මොනවාද සහ ඔබ බියෙන් නිදහස් වූ අවස්ථාවක් තිබුණාද?
- ඔබ මුහුණ දුන් අභියෝග කිහිපයක් සඳහන් කරන්න. එසේම එම අභියෝග ජය ගැනීමට ඔබට හැකි වූයේ කෙසේද යන්න පිළිබඳව අපට පවසන්න?
- සත්කාරක ප්‍රජාව වෙත ඔබ ගිය ගමනේදී ඔබ මුහුණ දුන් සංස්කෘතික බාධාවන් මොනවාද? (වයස, වාර්ගිකත්වය, භූගෝලීය, ආගමික හා සංස්කෘතික) හා ඔබ එම බාධාවන් ජය ගත්තේ කෙසේද?










---

**භීතින්:**
සත්කාකර පවුල හමු වීමට හෝ සත්කාකර ප්‍රජාව වෙත යාමට පෙර ඔබ බිය වූ හෝ කණගාටුවට පත් වූ දේ; ඔවුන්ව සම්පූර්ණයෙන් අවබෝධ නොවනු ඇතැයි යන ඔබගේ බිය, සත්කාරක භාෂාව කතා නොකිරීම හේතුවෙන් සන්නිවේදනය නිසි පරිදි සිදු නොවීම, හා හුදකලා හෝ තනි වූ හැඟීමක් දැනීම මීට ඇතුළත් විය හැකිය. නුහුරු පරිසරයක්, නිවසින් බැහැරව වෙනස් ස්ථානයක ජීවත් වීමේදී ඇති විය හැකි අපහසුතා, නුපුරුදු ආහාර වර්ග ආදිය පිළිබඳ බිය ආදී වශයෙන් අනෙක් භීතිකාවන් යටිතල පහසුකම් සම්බන්ධයෙන් විය හැකිය.

**සංස්කෘතික බාධාවන්:**
ඔබගේ සංස්කෘතියට වෙනස් වූ ප්‍රජාවක් තුළ ඔබ ජීවත් වේ. ඔවුන් කතා කරන භාෂාව, ඔවුන්ට තිබෙන ආහාර, ඔවුන් අදහන ආගම්, ඔවුන් සිදු කරන චාරිත්‍ර හා වතාවත්, එමෙන්ම ඔවුන් අඳින ඇඳුම් පැළඳුම් ආදීය.



## 6 වන පියවර
### කතන්දරය නිර්මාණ කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම

සහෘදයන් විසින් සත්කාරක ප්‍රජාව තුළ කතන්දර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වන අතරතුර ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින් සහෘදයන් මෙහෙයවීමට හා කතන්දර නිර්මාණයට මඟපෙන්වීමට උපදේශකයකු පත් කරනු ඇත. අවම වශයෙන් ක්ෂේත්‍ර චාරිකාවේ එක් වටයක දී උපදේශක විසින් එම යුගලයට සහය ලබා දෙනු ඇත. එමෙන්ම සහෘදයන් විසින් තමන් තොරාගත් කතාව පිළිබඳව උපදේශක දැනුවත් කිරීමටද කටයුතු කලයුතුය.

## 7 වන පියවර
### කතන්දරය නිෂ්පාදනය කිරීම

සෑම සහෘදයකු විසින්ම ප්‍රජාවන් ද්විත්වයටම බලපාන්නා වූ එක් පොදු ගැටළුවක් මත පදනම්ව හවුල්කරුවා හා එක්ව නිර්මාණය කරනු ලබන සහයෝගී බහුමාධ්‍ය කතන්දරයක් සමග සත්කාරක ප්‍රජාව මත පදනම් වූ තනි පුද්ගල MoJo කතන්දරයක් සහ බහුමාධ්‍ය පුවත් වාර්තාවක් නිෂ්පාදනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 8 වන පියවර
### කතන්දරය නිෂ්පාදනය කිරීම

වෙබ් මාධ්‍ය, සමාජ මාධ්‍ය සහ ප්‍රධාන මාධ්‍ය ඔස්සේ කතන්දර පුලුල් ලෙසින් සංසරණය වනු ඇත. එමෙන්ම, සහභාගීවන්නන් විසින් සමාජ මාධ්‍ය වේදිකා තුළ නිෂ්පාදන පළ කරනු ඇති අතර සමාන අදහස් සහිත ජනතාවට හා ජාලයන්ට එය බෙදා ගන්නා ලෙසට ආරාධනා කරනු ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින්ද කතන්දර බෙදා හැරීම සඳහා iVoice ඇතුළු ඔවුන්ගේ සමාජ ජාලා වේදිකා භාවිත කරනු ඇත. ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින් සහෘදයන් විසින් රචිත පුවත්/ලිපි ප්‍රධාන මාධ්‍යය තුළ බොදා හැරීම සඳහා තවදුරටත් සහයෝගය ලබා දෙනු ඇත.

## 9 වන පියවර
### සහෘදයන් ආපසු පිටත් වී යාම

MediaCorps ක්‍රියාවලිය සාර්ථක අයුරින් සම්පූර්ණ කිරීමෙන් පසුව, කතන්දර නිෂ්පාදනය සහ පසු නිෂ්පාදන ක්‍රියාවලීන් ඇතුළුව ක්ෂේත්‍රයේදී ලද අත්දැකීම් පිළිබඳව මතක් කිරීමටත් එම මතකයන් බෙදා ගැනීමටත් තවත් වරක් MediaCorps හමුවක දී සහෘදයන් රැස්වනු ඇත. වෙනසක් ඇති කරන වඩාත් සුවිශේෂී වූ ඔවුන්ගේ කතන්දර ඉදිරිපත් කරන හා ඒ පිළිබඳව සාකච්ඡා කරන්නා වූ වඩාත් සුවිශේෂී සිද්ධි ඇගයීමේ මෙවලම හරහා සහෘදයන් සම්බන්ධයෙන් විස්තරාත්මක ඇගයීමක් සිදු කරනු ඇත. මිත්‍රත්ව වැඩසටහන සාර්ථක ලෙසින් අවසන් කිරීම සැමරීමේ සම්මාන උළෙලකින් වැඩසටහන අවසන් කරනු ලැබේ.

# 04 වන කොටස

# බහුමාධ්‍ය තුළින් කතන්දර පැවසීම



## කතන්දරයක් පිළිබඳ අදහසක් බුද්ධිකලම්භනය කිරීම

බහුමාධ්‍ය කතන්දර නිෂ්පාදනය කිරීමේ දී සහ MediaCorps ඉලක්ක සම්පූර්ණ කිරීමේ දී ගැටුම හා කතන්දරයක් නිර්මාණය කිරීම පිළිබඳ මූලික කාරණා තුනක් සම්බන්ධයෙන් තීරණාත්මක මනසක් අවශ්‍ය වේ. පළමුව, ගැටුමෙහි ස්වභාවය පිළිබඳ ගැඹුරු අවබෝධයක්. දෙවනුව, වෛෂයික හා විශ්වසනීය දත්ත හා තෙවනුව, කතාවේ අංග. කතන්දරයේ අදහස හා සුදුසු අංග සම්බන්ධයෙන් තීරණය කිරීමේ දී සහෘදයන් මෙහෙයවීම සඳහා පහත සඳහන් ප්‍රශ්න උපකාරී කරගත හැකිය.



# ගැටුම/ගැටලුව

## ගැටුමක් හෝ ගැටලුවක් හඳුනාගන්න

- ප්‍රජාවන් අතර පවතින සාමයට මෙම ගැටලුව මගින් බලපෑමක් ඇති වන්නේද ?
- සහකම්පනය, විශ්වාසය ඇති කිරීමේ සහ ආත්ම විශ්වාසය ගොඩ  නැගීමේ හැකියාවක් මෙම ගැටලුවට තිබෙනවාද ?
- මෙම ගැටලුවට කතන්දරයක අංග තිබෙනවාද ?
- මෙම ගැටලුව දැනටමත් ආවරණය කර තිබේද ?

## ගැටුමට මූලික වූ හේතූන් දැනගන්න

- පසුබිම් වූ හේතූන් කවරේද ?
- සෘජු හෝ මූල හේතූන් මොනවාද ?
- වක්‍ර හේතූන් මොනවාද ?

## ගැටුමෙහි බලපෑම දැනගන්න

- මෙම ගැටුමෙහි/ගැටලුවෙහි බලපෑම කුමක්ද ?
- ගැටුම මගින් විවිධ කණ්ඩායම් කෙරෙහි ඇති කරන්නා වූ බලපෑම පිළිබඳව ඔබ දන්නේද ?

## පාර්ශවයන් දැන ගන්න

- ප්‍රශ්නය ඇති කරන්නා වූ පුද්ගලයන් කවරේද ?
- ප්‍රශ්නය මගින් බලපෑමට ලක් වූ පුද්ගලයන් කවුද ?
- මෙම ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කිරීමට උනන්දුවක් ඇත්තේ කා හටද?
- විසඳුමක් ළගා කර ගැනීමේ හැකියාව ඇත්තේ කාටද ?

## අපේක්ෂිත විසඳුම

- අපේක්ෂිත විසඳුම කුමක්ද ?
- මෙම විසඳුම යථාර්ථවාදීව ළගා කර ගත හැකි, යම් කාලයකට සීමා වන මැන බැලිය හැකි විසඳුමක් ද?



# කතන්දරය

## කතන්දරය පිළිබඳ තීරණය කරන්න

- මෙම කතන්දරය මගින් මිනිසුන්ගේ පීඩාවන් පිළිබිඹු වෙනවාද ?
- මිනිසුන්ගේ පෞද්ගලික අත්දැකීම් සම්බන්ධයෙන් මෙම කතන්දරය අදාළ වන්නේ කෙසේද ?
- මෙම කතන්දරය තුළින් පවසන්නේ මිනිසුන්ගේ කතන්දර ද ? එය පෞද්ගලික කතන්දරයක්ද ?

## කතන්දරයේ ව්‍යුහය අගයන්න

- ආඛ්‍යානමය ප්‍රගතියක් උත්තේජනය කරයිද ?
- විස්තරය ස්ථිතික ද ?
- සංවාදය හා චරිත හොඳින් හා නිවැරදිව නිරූපණය වෙනවාද ?
- සංයුතිය කෙසේද ?
- කථා වස්තුව සැලසුම් කළ ආකාරය නිවැරදිද ?

## සියල්ලන්ම ඇතුළත් වන්නේ දැයි පරීක්ෂා කරන්න

- මෙම කතන්දරය තුළින් අගතීන් හා පක්ෂපාතීභාවයන් ආමන්ත්‍රණය කරනවාද ?
- සබඳතාවන් වළක්වන්නා වූ දුර්මතයන් හා සැකයන් සම්බන්ධයෙන් මෙම කතන්දරය තුළ සඳහන් වෙනවාද ?
- මෙම කතන්දරය මගින් ඒකාකෘතීන් ආමන්ත්‍රණය කරනවාද ?

## සංවේදීභාවය පරීක්ෂා කරන්න

- මෙම කතන්දරය මගින් ගැටුම් උත්සන්න කරනවාද නැත්නම් අවුළුවනවාද ?
- එමගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආකල්පයක් ප්‍රමාණවත් පරිදි ඇති කරනවාද ?
- මෙම කතන්දරය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් යටපත් කරනවාද ?
- ඊට සම්බන්ධ යම් වාර්ගික, ඇදහිලි හා භූගෝලීය කණ්ඩායම් ඇතුළත් කර තිබේද ?

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආකල්ප පරීක්ෂා කරන්න

- මෙම කතන්දරය තුළ කාන්තාවන්, තරුණයින්, සහ සුළුතර කණ්ඩායම් ස්ථානගත කර තිබෙන්නේ කොහිද ?
- මෙම කතන්දරය තුළ පුරුෂයන් හා කාන්තාවන්ගේ, තරුණයන්ගේ සහ සුළුතර කණ්ඩායම්වල කාර්යයන් කවරේද ?
- මෙම කතන්දරය තුළ පුරුෂයන් හා කාන්තාවන්, තරුණයන් හා සුළු ජාතීන් අතර පවතින බල සබඳතා මොනවාද ?
- කාන්තාවන්, තරුණයින්, සහ සුළුතර කණ්ඩායම් වලට මෙම කතාවේ සඳහන් සිද්ධීන් සුවිශේෂී ලෙස බලපාන්නේ කෙසේද ?




- ඔබගේ කතන්දරය සඳහා ඔබට යම් ලේඛණ/තොරතුරු තිබේද ?
- සිද්ධිය පිළිබඳ සාක්ෂි හා අමතර කරුණු ඔබ විසින් රැස් කළේද/හඳුනා ගත්තේද?
- ප්‍රශ්න කිරීමකින් තොරව ඔබ විසින් තොරතුරු පිළිගත්තේද?


- සත්කාරක ප්‍රජාවේ සාමාජිකයන්ගෙන් විමසීම මගින් ඔබ විසින් සොයාගත් දත්තයන්හි වලංගුභාවය තහවුරු කරගත්තේද ?

## බහුමාධ්‍ය කතන්දර ව්‍යූහය තීරණය කිරීම

චිත්තාවේගී වශයෙන් බලවත් කතන්දර නිර්මාණය කිරීම සඳහා බොහෝ ක්‍රම තිබේ. සහෘදයන් විසින් සාමාන්‍ය රූපවාහිනී පුවත්, විස්තරාත්මක වීඩියෝ චිත්‍රපට හෝ කෙටි චිත්‍රපට නිර්මාණය කිරීම පමණක් MediaCorps වැඩසටහන තුළින් අපේක්ෂා නොකරයි. මීට අමතරව සැබෑ මිනිසුන්ගේ සහ සැබෑ මිනිසුන්ගෙන් කතන්දර සොයා ගැනීමට MediaCorps උත්සාහ කරයි. වීඩියෝ, පින්තූර, ශ්‍රව්‍ය සහ වෙනත් ශ්‍රව්‍ය දෘෂ්‍ය අංග ඇතුළු බොහෝ අංග මෙම කතන්දර තුළ තිබේ. ඉලක්කගත කණ්ඩායම් හා විෂය දෙස බලමින්, කොටස් තුනකින් යුතුව කතන්දරය දියුණු කිරීම යනු වඩාත් සරල සහ භාවිත කළ හැකි ආකෘතිය බවට MediaCorps විශ්වාස කරයි.

## කොටස් තුනකින් යුක්ත වූ ව්‍යූහය

බොහෝ අවස්ථාවන්හී දී විෂය වස්තුව මගින් කතාවේ ව්‍යූහය තීරණය කරනු ලැබේ. නමුත්, "කොටස් තුනකින් යුක්ත වූ ව්‍යූහය"යනුවෙන් සමහර අවස්ථාවන්හී දී හඳුන්වනු ලබන ආරම්භයක්, මැදක් හා අවසානයකින් යුක්තව වාර්තාමය චිත්‍රපටයක් සාමාන්‍යයෙන් සාදනු ලැබේ;



## ආරම්භය

කථාවක ආරම්භය මගින් තදින් සිත් ගන්නා වූ ආකාරයකට ප්‍රේක්ෂකයන්ගේ අවධානය ලබා ගැනීම අවශ්‍ය වේ. සම්පූර්ණ කතන්දරය සඳහාම පදනම සකස් කරනු ලබන්නේ මෙහි දී වන අතර ප්‍රේක්ෂකයා කුතුහලයට පත් වන සේ තවදුරටත් එය නැරඹීමට ඔහුට අවශ්‍ය වේ. කතන්දරය වෙත ප්‍රේක්ෂකයා ඇද ගන්නා හා තවදුරටත් එය පිළිබඳව දැනගැනීමේ අවශ්‍යතාවක් ඔවුන් තුළ ඇති කරන ගැටුමක්, ගැටලුවක් හෝ අසාමාන්‍ය අවස්ථාවක් ආරම්භය තුළින් නිරූපණය කරනු ලැබේ. සාමාන්‍යයෙන් ආරම්භයේ දී, පහත දැක්වෙන කථා අංගයන් භාවිත කරනු ලැබේ:

- මුලින්ම ප්‍රේක්ෂකයාගේ අවධානය අල්වා ගැනීම සඳහා ආකර්ෂණීය ආම්භයක්.
- පසුබිම (කොහේද?)
- ගැටුම හා කතන්දරයේ ඉලක්කය (කුමක්ද?) මෙහිදී තෝරා ගන්නා ලද ගැටලුව MediaCorps පරමාර්ථයන්ට අදාළ විය යුතුය.
- චරිතය (කවුද?), ගැටලුවෙන් හෝ ගැටුමෙන් බලපෑමට ලක් වී ඇත්තේ කවුද?
- මෙම පුද්ගලයා/පුද්ගල කණ්ඩායම මුහුණ දීමට යන අරගලය.
- කතන්දරයේ ස්වභාවය. මෙය ආරම්භයේ සිටම පැහැදිලි විය යුතුය. ඔබ විසින් කතන්දරය පදනම් කරගන්නාවූ ගැටලුව, එය සිදුවන ස්ථානය සහ එයට සම්බන්ධ ප්‍රධාන පුද්ගලයන් හඳුන්වාදීම යන සියල්ල තීරණය වන්නේ මෙහිදී ය.

## මැද

මෙය කතන්දරයේ මාංශයයි. කතන්දරය ප්‍රේක්ෂකයාට අවබෝධ කරවීමට එකිනෙක මත ගොඩ නැගෙන්නා වූ විවිධ ජවනිකාවන්ට වෙන් කරනු ලැබේ. මෙම කොටස් සැබවින්ම අනුපිළිවෙලින් තිබීම අවශ්‍ය නැත. සෑම ජවනිකාවකටම එයට අනන්‍ය වූ ආරම්භයක්, මැදක්, අවසානයක් තිබේ. එකට එකතු කරනු ලබන මෙම කුඩා ජවනිකා මගින් කතන්දරය නිර්මාණය වේ.


සාමාන්‍යයෙන්, මෙම කොටසේදී, යම් නිශ්චිත ගැටුමක් මගින් ඇති කරන ලද විවිධ බාධාවන්ට එක් සුවිශේෂී චරිතයක් හෝ චරිත මුහුණ දෙනු ඇත. නොඉවසිලිමත් බව ඇති වන්නේ හා බලපෑමට ලක් වූ පාර්ශවය විසින් තමන් ඉදිරියේ පවතින් ගැටලු/අභියෝග විසඳා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ප්‍රේක්ෂකයා කල්පනා කරන්නේ මෙහිදී ය. මැද කොටසට පහත සඳහන් අංග ඇතුළත් වේ;

- කතන්දරයේ උච්චතම අවස්ථාව පැමිණෙන තුරු ගැටලු ඇති කරනු ලැබේ: මේ වන විට ගැටුම හෝ ගැටලුව සම්බන්ධයෙන් (කුමක්ද) ප්‍රේක්ෂකයා සම්පූර්ණයෙන්ම දැනුවත්ය.
- බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ අරගලය ඇති කර ඇත; මේ වන විට බලපෑමට ලක් වී ඇත්තේ කවුද සහ ඒ හේතුවෙන් සිදු වූවේ කුමක්ද (කවුද සහ කුමක්ද) පිළිබඳව ප්‍රේක්ෂකයා ඉතා හොඳින් දැනුවත්ය.
- ගැටුමට හේතුව දනී; මේ වන විට ගැටුමට හේතුව (ඇයි) පිළිබඳව ප්‍රේක්ෂකයා දැන ගත යුතුය.
- ගැටුම විසඳීම සඳහා සුදුසු විකල්ප හෝ විසඳුම් ලබා දිය යුතු වේ.

## අවසානය

ආරම්භයේ දී ඇති කරන ලද හා මැද දී දියුණු කරන ලද ප්‍රශ්න සහ ගැටුම සඳහා කතන්දරයේ අවසානය මගින් සාමාන්‍යයෙන් විසඳුමක් ගෙන එයි. කතන්දරයක පිටපතක් ලිවීමේ දී, ආරම්භය හා මැද ලිවීමට උත්සාහ කිරීමට පෙර කතන්දරය අවසන් වන්නේ කෙසේද යන්න පිළිබඳව සැළකිල්ලට ගැනීම බොහෝ විට උපකාරී වේ. මෙය සහජ බුද්ධියට විරුද්ධ ලෙසින් පෙනිය හැකි, නමුත් මේ පිළිබඳව සිතීමට ඇති හොඳ ක්‍රමයක් වන්නේ ඔබ ගමනක් යෑමට යතුරු පැදියට නගිනවා යැයි සිතන්න. ගමන යෑමට අවශ්‍ය මාර්ගය තීරණය කිරීමට ඔබ පළමුවෙන්ම ඔබගේ ගමනාන්තය දැන ගත යුතුය. එසේ නොවුණහොත් ඔබ අතරමං විය හැකිය. මෙම පියවරේදී, ගැටුමට සුදුසු විසඳුමක් ලබාදීමට කටයුතු කෙරේ. නැතහොත් විෂය වස්තුව සම්පූර්ණයෙන්ම ප්‍රේක්ෂකයාට අවබෝධ වීමට සලස්වයි. එසේත් නොමැතිම් විවෘත අවසානයකකින් ප්‍රේක්ෂකයාට යමක් සිතීමට ඉඩ තබයි.

- පක්ෂපාතී බව හෝ සම්ප්‍රදායික චින්තනයට සම්පූර්ණයෙන්ම අභියෝග කරනු ලැබේ.
- ක්‍රියාකාරී වීමට පොළඹවයි
- ප්‍රධාන පණිවුඩය පැහැදිලිවේ.




**Source**
**http://ingridsundberg.com/2012/10/07/story-structure-diagrams/**



# 05 වන කොටස

# ඇමුණුම

## නිරන්තරයෙන් අසනු ලබන ප්‍රශ්න

### ක්ෂේත්‍ර චාරිකා



**01 ආගන්තුක තැනැත්තා රැඳී සිටිය යුත්තේ සත්කාරක සහෘදයාගේ නිවසේද නැතහොත් වෙනත් ස්ථානයකද?** ආගන්තුක තැනැත්තාට රැඳී සිටිය හැක්කේ කොහිද යන්න පිළිබඳව ආගන්තුකයාට හා සත්කාරකට තීරණය කළ හැකිය; එසේ වුවද, ආගන්තුක තැනැත්තා රැඳී සිටින්නේ සත්කාරකගේ නිවසේ හෝ සත්කාරකගේ විශ්වසනීය ඥාතියකුගේ/ මිතුරකුගේ නිවසෙහි නම් එය වඩා උචිත වේ. අමුත්තන්ගේ නිවාසයක හෝ හෝටලයක රැඳී සිටීම නිර්දේශ කරනු නොලැ,බේ.

**02 ආගන්තුක තැනැත්තා කෙතරම් කාලයක් සත්කාරක ප්‍රජාව තුළ රැඳී සිටිය යුතුද?** ආගන්තුක තැනැත්තා අඛණ්ඩව දින හතක් සත්කාරක ප්‍රජාව තුළ රැඳී සිටිය යුතුය. ආගන්තුක තැනැත්තා විසින් ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය වෙත සාධාරණීකරණයට හේතු දැක්විය හැකි ව්‍යතිරේඛී අවස්ථාවන් හී දී, එම රැඳී සිටීම උපරිම කොටස් තුනකින් සම්පූර්ණ කළ හැකිය (දින 3+2+2).

**03 සත්කාරක කාල සීමාව සඳහා වන කාර්ය සටහන සැලසුම් කළ යුත්තේ කවුද?** ආගන්තුක තැනැත්තා හා සත්කාරක යන දෙපාර්ශවයම විසින් සත්කාරක කාල සීමාව හොඳින් සැලසුම් කළ යුතුය. සත්කාරකගේ ප්‍රධාන කාර්ය භාරය වන්නේ ආගන්තුක තැනැත්තා සඳහා සැප පහසු හා ඵලදායී කාලයක් ගත කිරීම සඳහා පහසුකම් සැලසීම හා පරමාර්ථ ළඟා කරගැනීම සඳහා ඔහුට/ ඇයට උදව් කිරීම වේ.

**04 සත්කාරක ප්‍රජාව තුළ සහෘදයන්ට සංචාරය කළ හැකි ස්ථානයන් මොනවාද?** ආගමික ස්ථාන, ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන හා ස්මාරක. සංස්කෘතික ස්ථාන හා අවස්ථා සහ සාම්ප්‍රදායික නර්ථන, වේදිකා නාට්‍ය, සංගීත කණ්ඩායම්, කෞතුකාගාර, ජාතික උද්‍යාන, සත්කාරක ප්‍රජාව තුළ තිබෙන සුවිශේෂී ස්ථාන ආදී විනෝද ජනක අවස්ථා, යනාදිය.

**05 ඔබ එහි රැඳී සිටින කාලය අතරතුර භාවිත කළ යුතු ප්‍රවාහන මාධ්‍යය කුමක්ද?** එහි රැඳී සිටින කාලය අතරතුර, සහෘදයන් විසින් බස් රථ හා දුම්රිය වැනි පොදු ප්‍රවාහන සේවාවන් භාවිත කරනු ලැබිය හැකිය. වඩාත් අව්‍යාජ අත්දැකීමක් සඳහා බයිසිකල්, මෝටර් බයිසිකල් පැදීම සහ වෙනත් යම් පොදු ක්‍රමයක් භාවිත කිරීම සුදුසු බව නිර්දේශ කරනු ලැබේ. එසේ වුවද, දිගු දුරක් හෝ අහිතකර තත්ත්වයන් පවතින අවස්ථාවන් හී දී හැර ඇවිදීම සඳහා බෙහෙවින්ම දිරි ගන්වනු ලැබේ.

**06 ප්‍රති සත්කාර කිරීම සිදු කළ යුත්තේ කවදාද?** සත්කාර කිරීමේ පළමු වටයට ආසන්න කාලයක දී ප්‍රතිලෝම සත්කාර කිරීම සම්පූර්ණ කිරීම සුදුසු වේ. සත්කාරක තැනැත්තා එහි සිටීම හා ඔහුගේ පහසුව මත පදනම්ව සත්කාර කිරීමේ පළමු වටය සම්පූර්ණ කිරීමෙන් සති දෙකක් ඇතුළත ප්‍රතිලෝම සත්කාර කිරීම අත්‍යවශ්‍යයෙන්ම ආරම්භ කළ යුතුවේ.

**07 මතකයන් සහිත දිනපොත පිරවිය යුත්තේ කවදාද?** සත්කාරක ප්‍රජාව තුළ රැඳී සිටින කාලය අතරතුර ආගන්තුක තැනැත්තා විසින් දිනපතාම මතකයන් සහිත දිනපොත පිරවිය යුතුය. අවසානයේ දී, සියලු සහෘදයන් විසින් ඔවුන්ගේ මතක දිනපොත් ඉදිරිපත් කළ යුතුය. එහි ගත කළ සමය පිළිබඳ විස්තර, ඡායාරූප හෝ වෙනත් යම් තොරතුරු සහ අවශ්‍ය පරිදි ඇමුණුම් ඇතුළත් කරන්න.


IREX

## තනි පුද්ගල කතන්දර

**08 තනි පුද්ගල කතන්දරයක් යනු කුමක්ද?** තනි පුද්ගල කතන්දරයක් යනු සෑම සහෘදයකු විසින්ම, ඔහු/ඇය සත්කාරක ප්‍රජාව තුළ ගත කරන කාලය අතරතුර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නා වූ කතන්දරයකි.

**09 සුදුසු තනි පුද්ගල කතන්දරයක් හඳුනා ගැනීම සඳහා සහෘදයකු විසින් කොතරම් කාලයක් ගත කළ යුතුද?** එහි ගත කරන කාල වකවානුවේදී පළමු දින දෙක ඇතුළත සහෘදයා විසින් කතාවේ අදහස හඳුනාගත යුතුය.

**10 තනි පුද්ගල කතන්දර සඳහා තේමාවන් කවරේද?** සියල්ලන්ම අන්තර්ගත වන ප්‍රතිසන්ධානයක් ළඟා කර ගැනීම වළක්වන්නා වූ ඔහුගේ/ඇයගේ ප්‍රජාව නොවන වෙනත් ප්‍රජාවකට බලපාන ගැටලු, යුක්තිය නැවත ස්ථාපිත කිරීම පිළිබඳ කතන්දර, ගැටුමෙහි ආරම්භය, අනුකම්පාව, යුද්ධයෙන් බලපෑමට ලක් වූ තැනැත්තන්ගේ අරගලය පිළිබඳ සත්‍යය පවසන කතන්දර යොදා ගත හැකිය.

- සහකම්පනය, විශ්වාසය හා ආත්ම විශ්වාසය ඇති කරන සහ ඒ තුළින් විරුද්ධවාදී ප්‍රජාවන් අතර සබඳතාවන් ශක්තිමත් කරන කතන්දර.
- ප්‍රසිද්ධ මාධ්‍ය හරහා නොපෙන්වන අඩු වරප්‍රසාද ලත් හෝ ආන්තික ප්‍රජාවන් පිළිබඳ කතන්දර.

**11 එක් එක් සහෘදයා විසින් තනි පුද්ගල කතන්දර කොතරම් සංඛ්‍යාවක් නිෂ්පාදනය කළ යුතුද?** සෑම සහෘදයකු විසින්ම තනි පුද්ගල කතන්දර දෙකක්, එක් මෝජෝවක් හා එක් ලිපියක් නිෂ්පාදනය කළ යුතුය.

**12 එක් තනි පුද්ගල මෝජෝ කතන්දරයක් සඳහා ලබා දෙන කාල සීමාව කුමක්ද?** සෑම තනි පුද්ගල කතන්දරයක්ම සාමාන්‍යයෙන් මිනිත්තු 2-4 දක්වා දීර්ඝ විය යුතුය. මෙම කාලය ඉක්මවන්නා වූ කිසිදු කතන්දරයක් භාරගනු නොලැබේ.

**13 ආගන්තුකයා විසින් තනි පුද්ගල කතන්දරයක් නිෂ්පාදනය කිරීමේ දී සත්කාරකයාට මැදිහත් විය හැකිද ?** නැහැ, සත්කාරක විසින් කිසිදු ආකාරයකින් ආගන්තුකයා විසින් සිදු කරනු ලබන කතන්දර නිෂ්පාදනයට මැදිහත් නොවිය යුතුය.





## සහයෝගීතා කතන්දරය

14 **සහයෝගීතා කතන්දරයක් යනු කුමක්ද?** සහයෝගීතා කතන්දරයක් යනු සහෘදයන් විසින් සත්කාරක හා ආගන්තුකයා යන දෙපාර්ශවයම එකිනෙකාගේ ප්‍රජාව ආශ්‍රිතව සහයෝගයෙන් නිෂ්පාදනය කරනු ලබන කතන්දරයකි. සහෘදයන් විසින් එක්ව ඔවුන්ගේ ප්‍රජාවන් ද්විත්වයම මුහුණ දී ඇති පොදු ගැටලුවක් හඳුනා ගෙන, ඔවුන්ගේ විවිධ ආකල්ප ඉදිරිපත් කර එක්සත් වූ බහුමාධ්‍ය කතන්දරයක් නිෂ්පාදනය කළ යුතුය.

15 **බහුමාධ්‍ය කතන්දරයක් යනු කුමක්ද?** බහුමාධ්‍ය කතන්දරයක් යනු උද්‍ධෘත පාඨයන්, දත්ත, ඡායාරූප, ශ්‍රව්‍ය , සජීවි දර්ශන ද අඩංගු වන්නා වූ කතන්දරයකි. මෙම කතන්දරය වෙබ් මාධ්‍ය තුළ පළ කරනු ලැබිය හැකි විය යුතුය.

16 **සහයෝගීතා කතන්දරයක භාෂාව විය යුත්තේ කුමක්ද?** සහයෝගීතා කතන්දරයක් ඕනෑම භාෂාවකින් සකස් කරනු ලැබිය හැකියි. නමුත් එය සහෘදයන් දෙපළටම අයත් භාෂාවන්ගෙන් පළ කළ යුතුය.

17 **සහයෝගීතා කතන්දරයක ප්‍රධාන තේමාගත ක්ෂේත්‍ර හා එක් එක් තේමාව යටතේ පැමිණෙන ආදර්ශ තේමාවන් කවරේද?**

- **පශ්චාත් යුධ සංවර්ධනය පිළිබඳ කතන්දරඃ** ඉඩම් අයිතීන් පිළිබඳ ගැටලු, නැවත පදිංචි කරවීම, හිටපු සටන්කාමීන්, ස්ත්‍රී මූලික කුටුම්භ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, ලිංගික අපචාර, ක්ෂුද්‍ර මූල්‍ය, අතුරුදහන් වීම්, බිම් බෝම්බ ආශ්‍රිත ගැටලු, ජලය ආශ්‍රිත ගැටලු යනාදිය.
- **විවිධත්වය, සංස්කෘතීන් අතර සංවාදය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කතන්දරඃ** කුලය මත පදනම්ව වෙනස්කොට සැළකීම, සුනාමියෙන් බලපෑමට ලක් වූ පවුල්, නියඟය, ගංවතුර සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත් වූවන්ට වන්දි ලබා දීම.
- **ආන්තිකකරණය වූ ප්‍රජාවන්ට බලපාන ගැටලු පිළිබඳ කතන්දරඃ** සමාජ සම්මතයන්, පශ්චාත් කම්පන ආතතිය ආශ්‍රිත ආබාද වැනි මානසික සෞඛ්‍ය ගැටලු, ආන්තිකකරණය වූ කණ්ඩායම්, අතුරුදහන් වූ තැනැත්තන්ගේ දරුවන්, යුද්ධය හේතුවෙන් අහිමි වූ දෙමව්පියන්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, දික්කසාද නඩු, යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත් වූවන්, සමලිංගික සේවනයේ යෙදෙන ස්ත්‍රීන් හා පුරුෂයන්, ද්විලිංගිකයන් හා සංක්‍රාන්තික සමාජභාවී ලිංගිකයන් ඇතුළත් ප්‍රජාව සහ කාන්තාවන්, දුබලතාවන් සහිත පුද්ගලයන් හා ළමුන් මුහුණ දෙන ගැටලු.

18 **ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදය විසින් තවදුරටත් එම කතන්දර සංස්කරණය කරන්නේද?** ඔව්, ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍ය සංසදයේ ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය විසින් සහෘදයන් අතින් නිෂ්පාදනය කරන ලද කතන්දර සම්බන්ධයෙන් පොදු නමක් හා ටැග් කිරීමේ ක්‍රමයක් එකතු කිරීම ආදී වශයෙන් අවසාන සකස් කිරීමක් සිදු කරනු ඇත. එසේ වුවද, ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදී සංසදය විසින් කතන්දරයේ ව්‍යුහය වෙනස් කරන ආකාරයේ කිසිදු විශාල වෙනස්කමක් සිදු නොකරනු ඇත.

## අවසන් දින හා ඉදිරිපත් කිරීම්

19 **සත්කාර සහ ප්‍රතිසත්කාරක වට සම්පූර්ණ කිරීම සඳහා පවතින අවසන් දිනය කුමක්ද? නිෂ්පාදනය කළ කතන්දර ඉදිරිපත් කළ යුත්තේ කවදාද?** සත්කාකර කිරීම හා ප්‍රතිලෝම සත්කාර කිරීම යන ද්විත්වයම පුහුණු වැඩසටහනින් පසුව මාස දෙකක් තුළ තම නිශ්පාදන සම්පූර්ණ කළ යුතුය.

20 **නිෂ්පාදනය කළ කතන්දර ඉදිරිපත් කළ යුත්තේ කවදාද?** ප්‍රතිසත්කාර කිරීම සම්පූර්ණ කිරීමෙන් සති දෙකක් ඇතුළත සියලු කතන්දර ඉදිරිපත් කළ යුතුය.

## කතන්දර බෙදා හැරීම සහ ප්‍රකාශන හිමිකම්

21 **කතන්දර බෙදා හැරීම සඳහා භාවිත කළ හැකි වේදිකාවන් මොනවාද?** ප්‍රවාහගත, වෙබ් මූලික මාධ්‍ය, විශේෂයෙන්ම සමාජ මාධ්‍ය තුළ, කතන්දර බෙදා හැරිය හැකිය. විශේෂයෙන්ම සමාජ මාධ්‍ය වේදිකා තුළ සිය කතන්දර පිළිබඳව අර්ථාන්විත සාකච්ඡාවක් ඇති බවට සහෘදයන් විසින් ද සහතික විය යුතුය.

22 **කතන්දරවල ප්‍රකාශන අයිතිය ඇත්තේ කා හටද?** කතන්දරය නිෂ්පාදනය කළ සහෘදයන්ට මෙන්ම ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදීන්ගේ සංසදයට යන පාර්ශවයන් දෙකටම කතන්දර සම්බන්ධයෙන් ප්‍රකාශන අයිතිය තිබෙනු ඇත.

## ඒකඟතාවය

23 **ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදීන්ගේ සංසදය හා MediaCorps සහාදයන් අතර තිබෙන ගිවිසුමට නීත්‍යානුකූල බැඳීමක් තිබේද?** ඔව්, ගිවිසුම කඩ වුවහොත්, **MediaCorps** සහෘදයා මුළු දීමනා මුදල ශ්‍රී ලංකා සංවර්ධන ජනමාධ්‍යවේදීන්ගේ සංසදය වෙත ආපසු ලබා දිය යුතුය.

24 **යම් සහාදයකුට ගිවිසුමෙන් ඉවත් විය හැකිද?** පාර්ශවයන් දෙක විසින්ම ගිවිසුම අත්සන් කළ පසු යම් සහෘදයකුට **MediaCorps** මිත්‍රත්ව ගිවිසුමෙන් ඒකපාර්ශවිකව ඉවත් විය නොහැක.

25 **ගිවිසුම මගින් යම් සහාදයකු වෙත පවරන ලද කාර්යයන් සම්පූර්ණ කිරීමට ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් කුමක් සිදු වේද?** ගිවිසුමෙහි කාර්යයන් ඉටු කිරීමට සහෘදයා අපොහොසත් වන්නේ නම්, ගිවිසුම අනුව කතන්දර නිෂ්පාදනය කිරීම සඳහා ඔහු/ඇය වෙත ලබා දෙන ලද සම්පූර්ණ මුදල ඔහු/ඇය විසින් ආපසු ලබා දිය යුතුය.

26 **කාර්යයන් ඉටු කිරීමට එක් හවුල්කරුවකු අපොහොසත් වන්නේ නම්, යුගලයේ සිටින අනෙක් හවුල්කරුවාද ගිවිසුම කඩ කර ඇති ලෙස සළකනවාද? නැත.** ගිවිසුම ඇති කර ගෙන ඇත්තේ එක් එක් තනි පුද්ගල සහෘදයා සමග මිස එක් එක් යුගලය හෝ කණ්ඩායම සමග නොවේ. එහි ප්‍රතිඵලය දැරිය යුත්තේ ගිවිසුම කඩ කරන ලද සහෘදයා විසින් මිස ඔහුගේ/ඇයගේ හවුල්කරුවා (හවුල්කරුවන්) විසින් නොවේ.





# වචන මාලාව

**පුරවැසි මාධ්‍යවේදියා-** තොරතුරු එකතු කිරීම, වාර්තා කිරීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම යන ක්‍රියාවලියෙහි සක්‍රීය ලෙසින් නිරත වී සිටින පොදු පුරවැසියෙක්.

**පුරවැසි අධ්‍යාපනය-** සහභාගීත්ව පාලනයක් තුළ මිනිසුන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කරන අතරතුර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියකට සහභාගී වීම සඳහා පුරවැසියන්ට අධ්‍යාපනය ලබා දීමේ, සන්නද්ධ කිරීමේ හා බල ගැන්වීමේ ක්‍රියාවලියයි.

**ගැටුම-** විවිධ විශ්වාස සහ අදහස් ඇති පුද්ගලයන් හෝ ප්‍රජාවන් අතර පවතින ආරවුලකට හේතුව විය හැකි යම් එකඟ නොවූ තත්ත්වයක්.

**සංවාදය-** සුහද එකඟතාවක් හෝ සමතයක් ඇති කරගැනීමේ ඉලක්කය සහිතව, යම් නිශ්චිත ගැටලුවක්, විශේෂයෙන්ම දේශපාලන හෝ ආගමික ගැටලුවක් සම්බන්ධයෙන් අදහස් හෝ මත හුවමාරු කර ගැනීමක්. සංවාදය මගින් ගැටුම් නිරාකරණය උදෙසා වන හවුල් උත්සාහයන් දියුණු කිරීමට මෙන්ම එකිනෙකා සමග ගැටුම්කාරීව කටයුතු කරන පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර සබඳතා, අවබෝධය හා විශ්වාසය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරයි.

**වෙනස් කොට සැළකීම-** ජාතිය සහ වර්ණය වැනි පෞද්ගලික ලක්ෂණ මත පදනම්ව සමානාත්මතාවය ප්‍රතික්ෂේප කිරීම. වෙනස් කොට සැළකීම සාමාන්‍යයෙන් අගතීන් සහ ඒකාකෘතීන් මත පදනම් වේ.

**අවතැන් වීම-** ප්‍රචණ්ඩත්වය, යුද්ධය, පීඩාවන් හෝ වෙනත් ස්වභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදාවන් හේතුවෙන් සිය සාමාන්‍ය පදිංචි ස්ථානයෙන් යම් පුද්ගලයකු බලයෙන් ඉවත් කිරීම.

**විවිධත්වය-** ජාතිය, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික නැඹුරුතාවය, සමාජ-ආර්ථික තත්ත්වය, වයස, ශාරීරික හැකියාවන්, ආගමික විශ්වාස හෝ වෙනත් මතවාදයන් යන පැතිකඩ ඔස්සේ පුද්ගලයන් තුළ තිබෙන වෙනස්කම් සමූහයක්. එම වෙනස්කම් හඳුනාගැනීම හා ඉවසීම මෙන්ම තමන්ට වඩා වෙනස් ගතිගුණ හා අත්දැකීම් කෙරෙහි අන්‍යෝන්‍ය ගෞරවය දැක්වීමට පුරුදු වීම ද එයින් අදහස් වේ.

**සර්ව සාධාරණත්වය-** සමාන වීමේ තත්ත්වය (සමාන වරප්‍රසාද, අයිතීන් හා තත්ත්වයන්)

**සමාව-** හානියක් සිදු කරන ලද වෙනත් යම් තැනැත්තකු හෝ ප්‍රජාවක් කෙරෙහි පවතින අමනාපය, පලි ගැනීම හෝ තරහ යන සෘණාත්මක සිතුවිලි අත්හැර දැමීමට ගනු ලබන සවිඥානික තීරණයක්.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය:** පුරුෂයන් සහ කාන්තාවන් සඳහා උචිත බවට යම් සමාජයක් විසින් සළකනු ලබන සමාජීය වශයෙන් නිර්මාණය කරන ලද කාර්ය භාරයන්, චර්යාවන් සහ ගුණාංග. එම කාරණා සංස්කෘතීන් සහ කාලය ඔස්සේ වෙනස් වේ.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත භූමිකාවන්-** පුරුෂ මූලික චාරිත්‍රානුකූල හෝ ආගමික පරිචයන්, ජන වාර්ගික හෝ සංස්කෘතික ආකල්ප, පන්තිය හෝ කුලය, විධිමත්/අවිධිමත් නීති පද්ධති සහ ආයතනික සැලසුම් මගින් නිර්වචනය කරන ලද සහ වැඩිදුරටත් ශක්තිමත් කරන ලද පුරුෂයන් සහ කාන්තාවන් අතර බෙදා වෙන් කළ කාර්යයන් හා වගකීම්.

**උපශමනය-** අහිමි වීම සහ කම්පාව පිළිබඳ හැඟීම් පිළිගැනීමේ සහ මානසික යහපැහැත්ම නැවත ඇති කරගැනීමේ ක්‍රියාවලිය.





**අන්තර්ගත කිරීම-** අන්තර්ගත කිරීම යනු විවිධත්වය පිළිගැනීමේ හා කිසිවක් හෝ කිසිවෙකු අත් නොහැර හෝ කිසිවකු ආන්තිකකරණය නොකර සියලු වාර්ගික කණ්ඩායම්, ආගම්, අදහස් යනාදිය මත සහ පසුබිම් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලියයි.

**සංකලනය-** (කොටස්) සමස්ථයක් ලෙස ඒකාබද්ධ කිරීම; ජාතිය, ආගම හෝ වෙනත් යම් වෙනස්කම් නොතකමින් සමාජ සමාන සාමාජිකයන් බවට පත් වීම හෝ පත් කිරීම.

**අහිමි වීම-** යම් පුද්ගලයෙක් හෝ යමක් අහිමි වීමේ හෝ අහිමි කිරීමේ ක්‍රියාව. එසේම එය ආර්ථික, සමාජීය හෝ මානසික අහිමි වීමක් විය හැකිය.

**අනුකම්පාව-** තමන්ට දඩුවම් කිරීමට හෝ හානි කිරීමට හැකියාව ඇති යම් තැනැත්තකු කෙරෙහි සිදු කරන සමාව දීමේ හා අත් හැරීමේ ක්‍රියාවක් හෝ එම තැනැත්තා වෙත පෙන්වනු ලබන අනුකම්පාව හෝ සමාව පිළිබඳ තත්ත්වයක්.

**ආන්තිකකරණය-** සමාජයේ සිටින යම් නිශ්චිත කණ්ඩායමක් හෝ පුද්ගල ප්‍රජාවක් කොන් කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම්, නිදහස සහ හඬ නොසළකා හැරීම. ස්ත්‍රී පුරුෂ සමාජභාවී නැඹුරුතාවය, සාමාජ ආර්ථික තත්ත්වය, වාර්ගිකත්වය, භාෂාව ආදිය මත පදනම්ව ආන්තිකකරණය සිදු වේ.

**මාධ්‍ය-** පුවත්, විනෝදාස්වාදය, අධ්‍යාපනය හෝ ප්‍රචාරණ පණිවුඩ බෙදා හරිනු ලබන සන්නිවේදන නාලිකා.

**බහු සංස්කෘතිකවාදය-** විවිධ ජාතීන්ගේ සංස්කෘතීන්ගෙන් සමන්විත වන, සම්බන්ධ වන හෝ ඒ වෙනුවෙන් සැලසුම් කරන ලද බහුසංස්කෘතික වීමේ තත්ත්වය. ප්‍රජාවක් තුළ විවිධ වාර්ගික සංස්කෘතීන් පවත්වාගෙන යාමේ ප්‍රතිපත්තිය. විවිධත්වය ධනාත්මක අයුරින් පිළිගැනීමේ, අගය කිරීමේ සහ භාවිත කිරීමේ තත්ත්වය.

**නව මාධ්‍ය-** ඩිජිටල් තාක්ෂණ භාවිත කිරීම මගින් ජන සන්නිවේදනය කිරීමේ මාර්ග. අන්තර්ක්‍රියාකාරී ලෙසින් භාවිත කරන්නාගේ ප්‍රතිචාර ලබා ගැනීම සහ නිර්මාණශීලී සහභාගීත්වය එයට සාමාන්‍යයෙන් ඇතුළත් වේ. ජංගම දුරකථන යෙදුම්, මාර්ගගත ජනමාධ්‍ය වේදිකා සහ ජනතාවගේ අදහස් ලබා ගැනීම මීට උදාහරණ වේ.

**වෛෂයික-** පෞද්ගලික විශ්වාස හෝ අදහස්වල බලපෑමකින් තොරව සත්‍ය කරුණු මත පදනම් වීම.

**අගතිය-** පූර්වයෙන් විනිශ්චය කිරීම, අන්‍යයන්ගේ අදහස් මත පදනම්ව සහ ප්‍රමාණවත් නොවූ කරුණු මත පූර්ව නිගමනය කළ අදහසක්, විශේෂයෙන්ම අහිතකර අදහස් ඇති කර ගැනීම මෙහි වචනාර්ථයෙන් අදහස් වේ. කිසිදු නීතියකට අගතිගාමී ආකල්ප වැළැක්විය නොහැකි නමුත් අගතිමය හේතුවෙන් ඇති වන එවැනි ආකල්ප මෙන්ම වෙනස් කොට සැළකීම් සිදු කරන පරිචයන් හා චර්යාවන් තහනම් කිරීමට එයට හැකියාව ඇත.

**ජාතිවාදය-** ජාතිය, ආගම, ජාතික සම්භවය, උපන් ස්ථානය හෝ පරම්පරාව මත පදනම්ව යම් පුද්ගල කණ්ඩායමක් නොසළකා හැරීම. ප්‍රවේණිගත සාධක මගින් නිශ්චය කරනු ලබන සුවිශේෂී සංස්කෘතික ලක්ෂණ ජාතීන් සතුව ඇති බවට හා මේ හේතුවෙන් යම් ජාතීන්ට අනෙක් ජාතීන්ට වඩා සුවිශේෂී උසස් භාවයක් ලැබෙන බවට වන විශ්වාසය. එවැනි යම් විශ්වාසයක් මත පදනම්ව වෙනත් ජාතියකට අයත් සාමාජිකයන් කෙරෙහි දක්වන නින්දා සහගත හෝ කලහකාරී හැසිරීම. එසේම ජාතිවාදය යන වචනය මගින් අන්ධ, අහේතුක වෛරය, ඊර්ෂයාව හෝ අගතිය අදහස් වේ. කුරුටු ගී, බිය ගැන්වීම හෝ ශාරීරික හිංසනය වැනි ජාතිවාදය පිළිබඳ සමහර ප්‍රකාශයන් ඉතා පැහැදිලි වේ.





**ප්‍රතිසන්ධානය-** ගැටුම්කාරී තත්ත්වයකට පසුව ප්‍රජාවන් හෝ වාර්ගික කණ්ඩායම් දෙකක් අතර සුහදශීලී සබඳතා නැවතත් යථා තත්ත්වයට පත් කිරීම.

**ලිංගභේදය-** කාන්තාවන් හා පුරුෂයන් අතර පවතින ජීව විද්‍යාත්මක සහ ශාරීරික වෙනස්කම් හඳුනාගැනීම.

**සමාජ මාධ්‍ය-** සමාජ ජාලකරණයට සහභාගී වීම සඳහා භාවිත කරන්නන් වෙත හැකියාව ලබා දෙමින් ප්‍රජා මූලික ආදානය, අන්තර්ගතය බෙදා හැරීම, සහ සහයෝගීතාව කෙරෙහි කැප වූ මාර්ගගත සන්නිවේදන නාලිකා. වර්තමානයේ පවතින ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ජාල කිහිපයක් වන්නේ ෆේස් බුක්, ට්විටර්, සහ ඉන්ස්ටග්‍රෑම්.

**ඒකාකෘතිකරණය-** යන්නෙන් 'ස්ථිර රූපයක්' අදහස් වේ. මෙම වචනය මිනිසුන් සම්බන්ධයෙන් අදාළ වන විටදී, සාමාන්‍යයෙන් අසත්‍ය හෝ අසම්පූර්ණ තොරතුරු මත පදනම්ව යම් පුද්ගල කණ්ඩායමක් සම්බන්ධයෙන් සාම්ප්‍රදායික හෝ ස්ථිර රූපයක් ඇති කිරීම අදහස් වේ. බොහෝ ඒකාකෘතීන් මගින් සෘණාත්මක අදහස් ලබා දෙයි.

**මාධ්‍ය තුළ ඒකාකෘතිකරණය-** මාධ්‍ය තුළ ඒකාකෘතිකරණය යනු මාධ්‍ය විසින් ප්‍රේක්ෂකයන් වෙත බෙදා හරින ලද යම් ප්‍රජාවක් හෝ සමාජ කණ්ඩායමක් සම්බන්ධයෙන් වන සාමාන්‍යකරණය කළ හෝ පූර්ව නිගමනය කළ අදහස් වේ.

**කැළල-** ලැජ්ජාවක් හෝ අපකීර්තියක් වශයෙන් යම් සමාජයක් විසින් යම් අවස්ථාවන්හී දී අර්ථ නිරූපණය කරනු ලබන යම් අවස්ථාවක්, ගුණාංග යක් හෝ යම් පුද්ගලයෙක් හා සම්බන්ධ සෘණාත්මක අදහසක්.

**ආත්මීය-** කරුණුවලට වඩා යම් පුද්ගලයකුගේ අදහස් හෝ විශ්වාස මත පදනම් වීම.

**සාම්ප්‍රදායික මාධ්‍ය-** පුවත්පත්, ගුවන් විදුලිය, හා රූපවාහිනිය ඇතුළු ගතානුගතික ස්වරූපයේ මුද්‍රිත, සහ ඩිජිටල් මාධ්‍ය.

**සංක්‍රාන්තික යුක්තිය-** ගැටුමෙන් මතු වන දේශයන් විසින් සාමාන්‍ය යුක්තිය පසිඳලීමේ පද්ධති මගින් විසඳිය නොහැකි විශාල ප්‍රමාණයේ මානව හිමිකම් උල්ලංඝනය වීම්, විශාල ප්‍රමාණයේ හිංසනයන් සහ ඒකාධිපති පාලනය විසඳීමේ ක්‍රියාවලිය. එසේම පුද්ගලයන්ගේ අභිමානය හඳුනාගනිමින් හා එවැනි ගැටුම් නැවත ඇති නොවන බවට සහතික වීම සඳහා වැළැක්වීමේ පියවර ගනිමින් වගවීම, යුක්තිය හා ප්‍රතිසන්ධානය සහතික කිරීමට ද එමගින් අපේක්ෂා කරයි.

**සත්‍යතාවය තහවුරු කිරීම-** අන්තර්ගතය (කුමක්ද, කවුද, කවදාද, කෙසේද) හඳුනාගැනීම සහ ඩිජිටල් මූලාශ්‍ර හා යම් ඩිජිටල් තොරතුරක් පටිගත කිරීමට අදාළ භූ ස්ථාන වැනි පාර දත්ත හඳුනා ගැනීමේ ක්‍රියාවලිය. අනෙක් පවතින මූලාශ්‍ර සමග පවතින තොරතුරු සම්බන්ධයෙන් හරස් සඳහන් කිරීමක් සිදු කිරීම මගින් මෙම හඳුනා ගැනීම සාමාන්‍යයෙන් සිදු කරනු ලැබේ.

**අතති භීතිකාව-** විදේශිකයන් හෝ ආගන්තුකයන් හෝ ඔවුන්ගේ දේශපාලනය හෝ සංස්කෘතිය කෙරහි ඇති වෛරය හෝ බිය.

# සම්පත්

## BBC Media Action

බීබීසී මාධ්‍ය ක්‍රියාමාර්ගය යනු 1999 දී බීබීසී විසින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවර්ධන පුණ්‍යායතනයකි. දරිද්‍රතාවය අවම කිරීම, සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම සහ මිනිසුන්ගේ අයිතීන් අවබෝධ කරගැනීම සඳහා ඔවුන්ට සහය වීම සඳහා එය විසින් මාධ්‍ය හා සන්නිවේදනය භාවිත කරයි. එය බීබීසී ලෝක සේවය හා වෙනත් බීබීසියට අයත් දෙපාර්තමේන්තු සමග සමීපව කටයුතු කරයි.
*www.bbc.co.uk/blogs/bbcmediaaction*

## DW Akademie

ස්වාධීන මාධ්‍ය සහ වගකිවයුතු ජනමාධ්‍ය කලාවක් ලොව පුරාම අත්‍යවශ්‍ය වන බවට වන විශ්වාසයත් සමග, ඩී ඩබ්ලිව් ඇකඩමි විසින් ස්වාධීන, විනිවිදභාවයකින් යුක්ත මාධ්‍ය පද්ධති, ගුණාත්මක මාධ්‍ය කලාවක් සහ මාධ්‍ය විශේෂඥතාවයක් දියුණු කිරීම සඳහා සහය ලබා දෙයි. පශ්චාත් අර්බුද හා පශ්චාත් ගැටුම් පරිසර තුළ මාධ්‍ය නැවත ගොඩ නැගීමට එය විසින් සහයෝගය ලබා දෙන අතර මාධ්‍යවේදීන් වෘත්තීයමය වශයෙන් පුහුණු කිරීම සඳහා අන්තර්ජාතික වශයෙන් දායක වෙයි. එහි හවුල්කරුවන් විසින් සංස්කෘතික අනන්‍යතාවයට ගරු කරමින් පුහුණුවට නැඹුරු, අන්තර් ක්‍රියාකාරී හා නව්‍ය ව්‍යාපෘති සැලසුම් සිදු කිරීම සම්බන්ධයෙන් එක් වී සමීපව කටයුතු කරයි.
*www.dw.com/en/dw-akademie/about-us/s-9519*

## Free Press Unlimited

විශේෂයෙන්ම ගැටුම් සහිත අවස්ථාවන්හී දී, ප්‍රේක්ෂකයා වෙත විශ්වාසනීය හා වෛෂයික පුවත් සැපයීමට කැප වී සිටින මාධ්‍ය සංවිධානයකි. එය නෙදර්ලන්තය පදනම් කරගත් සංවිධානයක් වන අතර වෘත්තීයවේදීන් 50 දෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමකින් සමන්විත වේ. යම් ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවයක් සහිත ඔවුන්ගේ කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරනු ලබන රටවල් 39 ක සමාන ව්‍යාපෘති සිදු කරනු ලැබේ.
*www.freepressunlimited.org/en*

## Fondation Hirondelle

ගැටුම්වලට මුහුණ දී ඇති ජනතාව, ඔවුන්ගේ එදිනෙදා ජීවිතය තුළ හා පුරවැසියන් වශයෙන් බල ගන්වමින් ඔවුන් වෙත තොරතුරු ලබා දෙන 1995 දී පිහිටුවන ලද ස්විස් ජාතික ලාබ නොලබන සංවිධානයකි. ස්විට්සර්ලන්තයේ ලොසේන් පදනම් කරගත් මෙම සංවිධානය මහද්වීප 3 ක පිහිටි දේශයන් 18 ක කටයුතු කර ඇත. යුද්ධයෙන් බලපෑමට ලක් වූ දේශයන්, පශ්චාත් ගැටුම් ප්‍රදේශ හා ප්‍රජාතන්ත්‍රවාදී සංක්‍රාන්තිය තුළ සිටින සමාජයන්ට ඔවුන්ට කතා කරන හා ඔවුන්ට හඬක් ලබා දෙන මාධ්‍ය වෙත ප්‍රවේශයක් ඇති බවට එහි කටයුතු හරහා තහවුරු කරයි. අපගේ ඉලක්කගත ක්ෂේත්‍රයන්ට ළඟා වීම සඳහා තිබෙන වඩාත් සුදුසුම මාධ්‍ය නාලිකා භාවිත කරනු ලබන පුවත්, තොරතුරු හා සංවාද වැඩසටහන් නිෂ්පාදනය කිරීම හා විකාශනය කිරීම, පුහුණු කිරීම සහ සංස්කරණය, කළමනාකරණ සහ ව්‍යූහාත්මක සහය තුළින් අපගේ මාධ්‍යයට හා හවුල්කරුවන්ට සහය වීම කෙරෙහි ඔවුන්ගේ කටයුතු තුළින් අවධානය යොමු කර ඇත.
*www.hirondelle.org/en*

## International Journalists’ Network (IJNet)

එය විසින් ගෝලීය මාධ්‍ය නවෝත්පාදන පුවත් යෙදුම් හා මෙවලම්, ලොව පුරා සිටින වෘත්තීය හා පුරවැසි ජනමාධ්‍යවේදීන් සඳහා තිබෙන පුහුණු අවස්ථා හා විශේෂඥ උපදෙස් සම්බන්ධ නවතම තොරතුරු සපයයි. ජනමාධ්‍යවේදීන් සඳහා වන අන්තර්ජාතික කේන්ද්‍රය මගින් ඇති කරන ලද අයි ජේ නෙට් විසින් භාෂා හතකින් - අරාබි, චීන, ඉංග්‍රීසි, පර්සියන්, පෘතුගාල, රුසියානු හා ස්පාඤ්ඤ - ගෝලීය දෘෂ්ටි කෝණයකින් වෙනස්වන ජනමාධ්‍ය ලෝකය අනුගමනය කරයි.
*www.ijnet.org*

## International Federation of Journalists (IFJ)

ලෝකයේ තිබෙන ජනමාධ්‍යවේදීන්ගේ විශාලතම සංවිධානයයි. එය 1926 පැරිස් නගරයේ දී පිහිටුවන ලද අතර අද වන විට එය නියෝජිතයන් 600, 000 කට අධික පිරිසක් සමග රටවල් 140 ක කටයුතු කරයි. ශක්තිමත්, නිදහස් හා ස්වාධීන ජනමාධ්‍යවේදී වෘත්තීය සමිති හරහා අයි එෆ් ජේ විසින් මාධ්‍ය නිදහස සහ සමාජ සාධාරණත්වය ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ක්‍රියාමාර්ගය ප්‍රවර්ධනය කරයි. එසේම එය විසින් මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය, හා බහුවිධතාවය ප්‍රවර්ධනය කරන අතර දේශපාලනික හා සංස්කෘතික අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පිළිබඳව විශ්වාස කරන අතර වෘත්තීය සමිති හා අනෙකුත් මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කරයි. එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ හා ජාත්‍යන්තර වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය තුළ ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් කතා කරන්නා වූ සංවිධානය අයි එෆ් ජේ වේ.
*www.ifj.org*

## The International Research & Exchanges Board (IREX)

ගෝලීය අධ්‍යාපනය හා සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂඥතාවයක් දක්වන ජාත්‍යන්තර, ලාභ නොලබන සංවිධානයකි. 400 කට වඩා අධික කාර්ය මණ්ඩලයක් සහිතව අති විශාල බලපෑමක්, ප්‍රායෝගික නිර්දේශ හා කල් පවත්නා හවුල්කාරීත්වයන් නිර්මාණය කිරීම සඳහා අයිරෙක්ස් ආයතනය රටවල් 100 කට අධික සංඛ්‍යාවක කටයුතු කරයි. එහි ප්‍රධාන ක්ෂේත්‍ර හතර වන්නේ තරුණයන් බලගැන්වීම, නායකයන් ඇති කිරීම, ආයතන ශක්තිමත් කිරීම හා ගුණාත්මක අධ්‍යාපනය හා තොරතුරු වෙත ප්‍රවේශය ව්‍යාප්ත කිරීමයි.
*www.irex.org*

## Internews

වසර 35 කට අධික කාලයක් තිස්සේ රටවල් 100 ක් තුළ කටයුතු කරමින් ඔවුන්ගේ දේශීය හවුල්කරුවන් සමග තිරසාර සංවිධාන සිය ගණනක් ගොඩනගා ඇත. මාධ්‍ය වෘත්තිකයන්, මානව හිමිකම් ක්‍රියාධරයන්, සහ තොරතුරු ව්‍යවසායකයන් දහසකගේ හැකියාවන් ශක්තිමත් කර ඇති අතර ජීවිත වැඩි දියුණු කරමින් හා නොනැසෙන වෙනසක් ඇති කරමින් ගුණාත්මක, දේශීය තොරතුරු තුළින් මිනිසුන් මිලියන සංඛ්‍යාවක් වෙත ළඟා වී ඇත.
*https://www.internews.org*

## International Media Support (IMS)

සන්නද්ධ ගැටුම්, ඒකාධිපති පාලනය, හා දේශපාලන වෙනස්කම් හේතුවෙන් බලපෑමට ලක් වූ දේශයන් තුළ පවත්නා දේශීය මාධ්‍ය වෙත සහය ලබා දීමට කටයුතු කරනු ලබන ලාභ නොලබන සංවිධානයකි. මහද්වීප හතරක් ඔස්සේ, මාධ්‍ය නිදහස ප්‍රවර්ධනය කිරීමට, වෘත්තීය මාධ්‍යකරණය ශක්තිමත් කිරීම සහ අභියෝගාත්මක අවස්ථාවන් තුළ කටයුතු කිරීමේ හැකියාවක් මාධ්‍යය සතු වන බවට තහවුරු කිරීමට අයි එම් එස් විසින් උපකාර කරයි. රුවන්ඩාව හා පැරණි යුගොස්ලෝවියාව තුළ පැවති බේදජනක සිදුවීම් හමුවේ 2001 දී අයි එම් එස් ආයතනය පිහිටුවන ලදී. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සදාචාරාත්මක සම්මතයන්ට අනුකූලව මාධ්‍ය අන්තර්ගතය නිර්මාණය කිරීමට හා බෙදා හැරීමට සහය වන අතර ජනමාධ්‍යවේදීන් උදෙසා වන සඵලදායී නීති සහිතව සුරක්ෂිත මාධ්‍ය පරිසරයක් තහවුරු කිරීම සඳහා කටයුතු කරයි. *www.mediasupport.org*

## International Federation of Journalists (IFJ)


අයි එෆ් ජේ, යනු යහපත් සමාජයක් සඳහා අත්‍යාවශ්‍ය වන විශ්වාසනීය පුවත් සැපයීම සඳහා මාධ්‍යවේදීන් බලගන්වමින් ලොව පුරා ජනමාධ්‍යකරණය ප්‍රවර්ධනය කරනු ලබන එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී සී හි පිහිටි ලාබ නොලබන වෘත්තීය සංවිධානයකි. ලොව පුරා සිටින වාර්තාකරුවන්ගේ විශේෂඥතාවය හා කතන්දර පැවසීමට ඇති හැකියාවන් ගොඩ නගමින්, ජනමාධ්‍ය කලාව හා තාක්ෂණය සම්බන්ධයෙන් අයි එෆ් ජේ  කටයුතු කරයි. ඔවුන්ගේ කටයුතු හරහා ජනමාධ්‍යවේදීන් විසින් පුවත් ආවරණය වැඩි දියුණු කරන අතර ඔවුන්ගේ ප්‍රේක්ෂකයන් සමග වඩාත් ගැඹුරින් සම්බන්ධ වේ. ඒ තුළින් යහපත් ප්‍රජාතන්ත්‍රවාදයකට මුල් ගලක් වන විශ්වාසය තැබිය හැකි, විශ්වාසනීය පුවත් ගලා ඒම වැඩි වෙයි. රටවල් 180 ක ජනමාධ්‍යවේදීන් 100, 000 කට වැඩි සංඛ්‍යාවක් සමග අයි එෆ් ජේ කටයුතු කරයි.
*www.ifj.org*

## The Media Diversity Institute

විවිධත්වය පිළිබඳ වගකිව යුතු මාධ්‍ය ආවරණය දිරිමත් කිරීමට සහ ඒ සඳහා පහසුකම් සැලසීමට අන්තර්ජාතික වශයෙන් කටයුතු කරන ලන්ඩන් නුවර මූලික කරගත් රාජ්‍ය නොවන සංවිධානයකි. චේතනාන්විතව හෝ චේතනාවකින් තොරව සමාජ කලබල, ආරවුල් සහ ප්‍රචණ්ඩකාරී ගැටුම් ඇති කළ හැකි අගතිය, නොඉවසිලිමත්බව, සහ වෛරය පැතිරවීමෙන් මාධ්‍යය වළකාලීම මෙහි ඉලක්කය වේ. විවිධ කණ්ඩායම් සහ සංස්කෘතීන් අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ඉක්මන්, සාධාරණ, නිවැරදි, සියල්ලන්ම ඇතුළත් කරන හා සංවේදී මාධ්‍ය ආවරණයක් සිදු කිරීමට එම්ඩී අයි විසින් දිරිමත් කරනු ලැබේ. විවිධත්වය පිළිබඳ මාධ්‍ය ආවරණය සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළ හැකි සමාජයේ සිටින සියලු ක්‍රියාධරයන් සම්බන්ධ කරගැනීමේ, ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමේ හා ඔවුන් පුහුණු කිරීමේ පරිපූර්ණ හා සාකල්‍ය ප්‍රවේශයක් එම් ඩී අයි විසින් අදාළ කර ගනියි.
*www.media-diversity.org*

## The Institute for War & Peace Reporting (IWPR)

වොෂින්ටන් ඩී සී හා ඇම්ස්ටර්ඩෑම් හි පිහිටි සම්බන්ධීකරණ කාර්යාල ද සහිතව ලන්ඩන් නුවර ප්‍රධාන කාර්යාලය පිහිටි  අන්තර්ජාතික සංවිධාන ජාලයකි. ලොව පුරා රටවල් 28 ක් තුළ අයි ඩබ්ලිව් පී ආර් කටයුතු කරයි. එය එක්සත් රාජධානිය තුළ පුණ්‍ය ආයතනයක් වශයෙන් ද නෙදර්ලන්තය තුළ පුණ්‍ය පදනමක් වශයෙන් ද ලියාපදිංචි කර ඇත. ගැටුම්කාරී, අර්බුදකාරී සහ සංක්‍රාන්තික අවධියේ සිටින ලොව පුරා දේශයන් තිස් හයක් තුළ සිටින දේශීය වාර්තාකරුවන්, පුරවැසි ජනමාධ්‍යවේදීන් හා සිවිල් සමාජ ක්‍රියාධරයන් සඳහා  අයි ඩබ්ලිව් පී ආර් විසින් සහය ලබා දෙයි. වෘත්තීය හා පුරවැසි වාර්තාකරුවන් පුහුණු කිරීම, ඔවුන්ට උපදෙස් ලබා දීම සහ අවස්ථාවන් ලබා දීම, හැකියාවන් ගොඩ නැගීම සහ ප්‍රසිද්ධ විවාද හා පුරවැසියන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම හරහා මාධ්‍ය හා සිවිල් සමාජය සතු කතා කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම මගින් සාමය හා යහපාලනය කෙරෙහි අප විසින් දායකත්වය සපයයි.
*www.iwpr.net*



# ආශ්‍රිත ග්‍රන්ථ හා පරිශීලන


Alankuş, S 2016, *Peace Journalism Handbook*, viewed 9 July 2018, https://bianet.org/files/static/bia_kitaplar/Peace_Journalism_Handbook_v04.pdf

Anon, 2014, *Reporting and Radicalization: and how it is relevant to you*, viewed 9 July 2018, https://terratoolkit.eu/wp-content/uploads/2014/09/TERRATOOLKIT_GUIDELINES_JOURNALISTS_web_26.pdf

Betz, M 2017, *How media can be an instrument of peace in conflict-prone settings*, viewed 9 July 2018, http://www.undp.org/content/dam/norway/undp-ogc/documents/UNDPOGC_Media_conflict%20roundtable%20background%20paper.pdf

Brounéus, K 2003, *Reconciliation–Theory and Practice for Development Cooperation*, viewed 9 July 2018, https://www.pcr.uu.se/digitalAssets/.../66768_1reconciliation---theory-and-practice.pdf

Council of Europe, n.d., *Toolbox: journalism training, discrimination and diversity*, viewed 29 July 2018, https://www.coe.int/t/dg4/anti-discrimination-campaign/ressources/Training_toolbox/Toolbox_Journalisme_Training_Discrimination_Diversity_en.pdf

Cruwys, T et al 2008, *Marginalized Australians: characteristic and predictors of exit over ten years 2001-2010*, viewed 9 July 2018, https://melbourneinstitute.unimelb.edu.au/assets/documents/hilda-bibliography/other-publications/2013/Cruwys_etal_marginalised_Australians.pdf

Diez, T, Stetter, S. & Albert, M 2006, 'The European Union and Border Conflicts: The Transformative Power of Integration', *International Organization*, vol. 60, no. 3, pp. 563-593.

*Future Voices*, viewed 29 August 2018, https://futurevoices.wordpress.com/

Galtung, J 2007, Peace Journalism as an Ethical Challenge, *Journal of International and Peace Studies*, No ¾ pgs. 7-9

Gautam, B 2016, *Code of Ethics for Journalists*, 13 September 2018, http://cemfree.org.np/wp-content/uploads/2016/03/Bimal_Gautam-Code_of_Ethics_for_Journalists.pdf

Hallgren, L 2012, *Peace and War Journalism: a critical discourse analysis of newspaper editorials on the topic of Iran's nuclear programme*, viewed 29 August 2018, www.diva-portal.org/smash/get/diva2:540134/fulltext01.pdf

Howard, R and Lloyd, F 2005, *Gender, Conflict and Journalism: a handbook for South Asia*, viewed 9 July 2018, unesdoc.unesco.org/images/0014/001439/143925E.pdf

IJNet 2017, *The IJNet multimedia journalism toolkit*, viewed 29 August 2018, https://ijnet.org/en/toolkit/ijnet-multimedia-journalism-toolkit

Inter Press Service 2009, *Reporting Gender Based Violence*, 13 September 2018, http:// www.ips.org/africa/library/publications/ips_reporting_gender_based_violence.pdf

Lederach, JP 1997, *Building Peace: Sustainable Reconciliation in Divided Societies.* Washington: United States Institute of Peace Press.

McGoldrick, A and Lynch, J 2000, *Peace Journalism*, viewed 9 July 2018, https://www.transcend.org/tri/downloads/McGoldrick_Lynch_Peace-Journalism.pdf

Michigan State University 2013, *Best Practices in Journalism*, viewed 13 September 2018, https://comartsci.msu.edu/sites/default/files/documents/student/jrn-code-of-ethics.pdf

Mowat, JG 2015, *Towards a New Conceptualization of Marginalization*, viewed 9 July 2018, journals.sagepub.com/doi/pdf/10.1177/1474904115589864

Nielson, J 2003, *War Reporting*, viewed 9 July 2018, https://web.stanford.edu/class/e297a/War%20Reporting.pdf

Race Forward 2015, *Race Reporting Guide*, viewed 9 July 2018, https://www.raceforward.org/sites/default/files/Race%20Reporting%20Guide%20by%20Race%20Forward_V1.1.pdf

Rioba, A 2008, *Defining Journalism Ethics*, 13 September 2018, http://www.zanzibarassembly.go.tz/documents/papers/MEDIA-ETHICS-FOR-ZANZIBAR-WORKSHOP.pdf

Rupar, V 2012, *Reporting Ethnicity and Religion*, viewed 29 August 2018, http://ethicaljournalisminitiative.org/assets/docs/107/024/7d0676b-793d318.pdf

Schiffe, Kand Schatz, E 2008, *Marginalization, Social Inclusion and Health*, viewed 9 July 2018, https://www.drugsandalcohol.ie/11927/1/Correlation_marginalisation_web.pdf

Schmickle, S 2003, *Reporting War*, https://dartcenter.org/sites/default/files/reporting_war.pdf

Spangle, ML 2017, *The Healing of America: The Path to Reconciliation*, viewed 9 July 2018, https://epublications.regis.edu/cgi/viewcontent.cgi?article=1204&context=jhe

Toit, P 2012, *Conflict Sensitive Reporting: A toolbox for journalists*, viewed 9 August 2018, https://www.internews.org/sites/default/files/resources/ConflictSensitiveReporting-Peter_du_Toit_2012-03.pdf

Toit, P 2014, *Reporting atrocities: a toolbox for journalists covering violent conflict and atrocities*, viewed 9 August 2018, https://www.internews.org/sites/.../Internews_ReportingAtrocitiesToolkit_2014-11.pdf

UNESCO 2012, *Gender Sensitive Indicators for Media*, 13 September 2018, http://www.unesco.org/new/fileadmin/MULTIMEDIA/HQ/CI/CI/pdf/IPDC/ipdc28_gsmi_paper_rev.pdf

Wolterink, J 2006, *Media as a tool for Reconciliation?*, viewed 29 July 2018, http://www.denieuwereporter.nl/wp-content/uploads/2007/08/scriptiecompleet2.pdf

Wyatt, WN 2014, *The Ethics of Journalism: individual, institutional and cultural influence*, 13 September 2018, https://reutersinstitute.politics.ox.ac.uk/sites/default/files/2017-12/The%20Ethics%20of%20Journalism%20-%20indivdual%2C%20institutional%20and%20cultural%20influences_Extract.pdf




Supported by

Prime Implementing Partner

Implemented by


Sri Lanka Development Journalist Forum
3/8 Swarna Place, Nawala road, Rajagiriya, Sri Lanka.
Phone: 94 117 209 511-2 80 62 65 / Mail: info@ldjf.org

www.Ldjf.org /sdjf @sdjf /sdjf